යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය
இளைஞர் அலுவல்கள் மற்றும் திறன்கள் அபிவிருத்தி அமைச்சு
**MINISTRY OF YOUTH AFFAIRS & SKILLS DEVELOPMENT**

# ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
# இலங்கை தொழிற்பயிற்சி அதிகாரசபை
# Vocational Training Authority of Sri Lanka

# *වාර්ෂික වාර්තාව*
# *வருடாந்த அறிக்கை*
# *ANNUAL REPORT*
# *2012*


''නිපුණතා පියස''
අංක 354/2, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

Nipunatha Piyasa"
No. 354/2" Elvitigala Mawatha"
Narahenpita" Colombo 05.

நிபுணதா பியச,"
இல.354/2 எல்விட்டிகல மாவத்தை.
நாராஹேன்பிட, கொழும்பு .05

# වාර්ෂික වාර්තාව
# 2012

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ තොරතුරු

**ආයතනය** - ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

**අමාත්‍යාංශය** - යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය.

**ලිපිනය** - "නිපුණතා පියස"
නො. 354/2,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

**ඊ මේල් ලිපිනය** - info@vtasl.gov.lk

**වෙබ් අඩවිය** - www.vta.lk

**විගණකවරු** - විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව

**බැංකුකරුවන්** - මහජන බැංකුව
- ලංකා බැංකුව
- කොමර්ෂල් බැංකුව

# පිළිගැන්වීම

ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

"නිපුණතා පියස"

නො : 354/2, ඇල්විටිගල මාවත,

කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

**වාර්ෂික වාර්තාව - 2012**

**<u>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය</u>**

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනතේ 25 වන වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව 2012 වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙයට,

විශ්වාසී,

කර්නල් එස්.ආර්. පී. රත්නායක (ආර්ඩබ්පී,ආර්එස්පී)

සභාපති,

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

2013.02.08

# අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ කාර්මික, වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව ලබාදෙන ප්‍රමුඛතම ආයතනය වීම.

# අපගේ මෙහෙවර

ජාතික හා ජාත්‍යන්තර නිපුණ සම්මතයන්ට ගැලපෙන නිපුණ ශිල්පීන් බිහිකරන ආයතනයක් ලෙස කටයුතු කිරීම.

# පටුන


| | | |
|---|---|---|
| 1. | පාලක මණ්ඩලයේ වාර්තාව | 01-05 |
| 2. | හැඳින්වීම | 06 |
| 3. | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ව්‍යුහය | 06-**12** |
| 4. | කාර්ය මණ්ඩලය පුහුණු කිරීම | 13-15 |
| 5. | වෘත්තීය පුහුණුව ලබාදීම | 16-23 |
| 6. | පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය හා ආධුනික සංඛ්‍යාව | **2**4 |
| 7. | වෘත්තීය මාර්ගෝපදේශනය | 25 |
| 8. | රැකියාගත කිරීම | 26-28 |
| 9. | ශිල්පීය දක්ෂතා වැඩි දියුණු කිරීම | 29 |
| 10. | අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම | 30 |
| 11. | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 31 |
| 12. | අභියෝග | 32 |

## 01.පාලක මණ්ඩලයේ වාර්තාව

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ජාතික වෘත්තීය පුහුණු ආයතන 08 ක්, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 22 ක් හා ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ස්ථානගතව ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 244 ක් වශයෙන් මධ්‍යස්ථාන 274ක ජාලයක් ලෙස දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන රාජ්‍ය අංශයේ ප්‍රමුඛතම ආයතනයක් වේ. ක්ෂේත්‍ර 18 ක් යටතේ පාඨමාලා 117 ක වැඩසටහන් 1,692 ක් ක්‍රියාත්මක වෙමින් 30,000කට ආසන්න තරුණ තරුණියන් සංඛ්‍යාවක් වාර්ෂිකව ජාතික ශ්‍රමබලකායට එක්කරනු ලැබේ.

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම ආයතනය 2012 වර්ෂයේදී එහි පරමාර්ථයන්ට අදාලව පහත සඳහන් කාර්යයන්හි යෙදුන අතර, එහි ප්‍රගතිය ඉදිරි පරිච්ඡේදයන්හී විස්තර කර ඇත.

- වෘත්තීය පුහුණු වැඩසටහන් සකස් කිරීම තුළින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම හා වෘත්තීය නිපුණතා ලබා ගත හැකි වන පරිදි අවශ්‍ය පුහුණුව සෘජුව හෝ අනිකුත් ආයතන තුළින් ලබා දීම.
- නිපුණතා පාදක ඇගයීම් පැවැත්වීම, අවසන් පරීක්ෂණ පැවැත්වීම සහ ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත් කිරීම හා අනෙකුත් වෘත්තිය සහතික නිකුත් කිරීම.
- වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශන ලබාදීම.
- වෘත්තීය පුහුණු වැඩසටහන් ඵලදායී ලෙස හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- වෘත්තීය පුහුණුව ලැබූ තරුණ පිරිසට වැඩිදුර පුහුණුව ලබාදීම, රැකියා ගත කිරීම හා ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා පහසුකම් සැපයීම.
- රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමග සම්බන්ධතා ගොඩ නැගීම මගින් ශිල්පීය දක්ෂතා වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම.
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය තුලින් වෘත්තීය පුහුණුව ග්‍රාමීය ප්‍රදේශ කරා ගෙන යාම.
- පෙර ඉගෙනුම හැඳින්වීම මඟින් සහතික නොලත් නිපුණතාවයන් ඇති පුද්ගලයින් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් පිරිනැමීම.
- වෙනත් ආයතන /පුද්ගලයින්ගේ ඉල්ලුම් මත වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම හා වෘත්තීය පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම.

## 2012 වර්ෂයේ දී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය අත්පත් කරගන්නා ලද ජයග්‍රහණයන්

- 2012 වර්ෂය තුලදි ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව යටතේ ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලා 130ක් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ප්‍රතීතනය ලබාගෙන ඇත. මෙතෙක් ප්‍රතීතනය ලබා ඇති සම්පූර්ණ පාඨමාලා සංඛ්‍යාව 516 කි.
- දිවයින පුරා දිස්ත්‍රික්ක 12ක හෝටල් පාසල් 14 ක් ආරම්භ කිරීම.
- පෙර ඉගෙනුම් හැඳින්වීම ක්‍රමවේදය (RPL) යටතේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 370 පිරිනමා ඇත. මෙතෙක් නිකුත් කර ඇති සම්පූර්ණ සහතික සංඛ්‍යාව 584 කි.
- බාහිර ආයතන සඳහා පුහුණුකරුවන් පුහුණු කිරිමේ වැඩසටහන් 6 ක් ක්‍රියාත්මක කිරීම තුලින් කැනේඩියානු ලෝක විශ්ව විද්‍යාල සේවය සඳහා පුහුණුකරුවන් 126 දෙනෙකු පුහුණු කිරීම.
- වව්නියා දිස්ත්‍රික්කයේ වෙන්වුලායි වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය අලුතින් ආරම්භ කරනු ලැබීය.
- මුලතිව් මුලිටෙක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, UNICEF ආධාර මත අලුතින් සංවර්ධනය කර ඇති අතර එම මධ්‍යස්ථානය ද නොබෝ දිනකින් විවෘත කිරිමට නියමිතය.
- යොවුන් සේනාංකය හා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුමට අනුව යොවුන් සේනාංක 9 ක් තුල රූපලාවන්‍යය සහා තොරතුරු තාක්‍ෂණ පාඨමාලා 18ක් ආරම්භ කිරිමට සැලසුම් කර ඉන් පාඨමාලා කිහිපයක් ආරම්භ කිරීම.
- ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය සහ ඉදිකිරීම් සංගමය සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමට අනුව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා නියුක්ත වුවන් සඳහා පෙර ඉගෙනුම හැඳින්වීමේ ක්‍රමවේදය (RPL) යටතේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකය ලබාදිමට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා සංචාරක හෝටල් හිමියන්ගේ සංගමය සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුමට අනුව වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණුව ලැබූ ආධුනිකයින් සඳහා වැඩිදුර පුහුණු අවස්ථා ලබාදීම.
- 2012 වසරේ පුහුණුව අවසන් කළ සිසුන්ගෙන් 7920 ක් රැකියාස්ථ පුහුණුව සඳහා යොමු කිරීම.

- 2012 වසර තුළ විදේශ රැකියා සඳහා 60 දෙනෙක්ද , ස්වයං රැකියා සඳහා 535 දෙනෙක්ද ,දේශීය රැකියා සඳහා 3,733 දෙනෙක්ද වශයෙන් පුහුණුලාභීන් 4,328 ක් රැකියා සඳහා යොමු කිරීමට හැකිවීම.

- රාජ්‍ය හා පෞද්ගලික අංශය අතර සම්බන්ධතාවය ගොඩනැංවීමේ අපේක්ෂාවෙන් ඇලුමෙක්ස් පුද්ගලික සමාගම, ඒ.බී.මයුරි සමාගම, ලංකා ටයිල්ස් සමාගම, ඩෙවිඩ් පීරිස් සමාගම, නේචර්ස් බියුටි ක්‍රියේෂන් සමාගම, ඔරිෆ්ලේම් පුද්ගලික සමාගම, ACL කේබල්ස්, ෆිනික්ස් ෆෝලෝ ගාර්ඩ් යන ප්‍රමුඛපෙළේ සමාගම් හා එක්ව විවිධ ක්ෂේත්‍රයන්හි ශිල්පීන් 3,083 ක් සඳහා ශිල්පීය කුසලතා වැඩිදියුණු කිරීමේ කෙටි කාලීන වැඩමුළු 30 ක් පැවැත්වීම.

- දිවයින පුරා වැඩමුළු 2,441 ක් පවත්වමින් පාසැල් සිසුන්, පාසැල් හැරයන සිසුන්, යෞවන සමාජ සාමාජිකයින්, වෘත්තිය පුහුණු ක්ෂේත්‍රයන්හි පුහුණුවන්නන්, ක්ෂේත්‍ර නිලධාරීන්, ගුරුවරු, යොවුන් සේනාංක පුහුණුවන්නන් වශයෙන් 121,452 ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන සේවා සැපයීම.

- ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 27 ක් හා ව්‍යාපාර කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 16 ක් තරුණ තරුණියන් 708 දෙනෙකු සහභාගි කරගනිමින් පැවැත්වීම.

- ස්වයං රැකියා සඳහා යොමු වූ පුහුණුලාභීන් 78 දෙනෙකුට රුපියල් මිලියන 17 කට ආසන්න මුදලක් ණය පහසුකම් වශයෙන් මහජන බැංකුව, ලංකා බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු රාජ්‍ය බැංකු වලින් ලබා ගැනිමට අවශ්‍ය පහසුකම් සැපයීම.

- සුදුසුකම් සපිරු ආධුනිකයින් 9,351දෙනෙකු සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පත් හා ජාතික වෘත්තීය සුදුසුකම් නොවන අනෙකුත් පාඨමාලා මඟින් සුදුසුකම් සපිරූ ආධුනිකයින් 6,601 දෙනෙකු සඳහා සහතික පත් නිකුත් කිරිමට හැකි වීම.

- දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 2ක් වූ මාතර තලල්ල පුහුණු මධ්‍යස්ථානයත් මඩකලපුව වන්දාරමුල්ල පුහුණු මධ්‍යස්ථානයත් වැඩිදියුණු කර ජාතික වෘත්තීය පුහුණු ආයතන බවට පත්කිරීම.

## 2013 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන් සහ අපේක්ෂිත ඉලක්ක.

- හෝටල් හා සංචාරක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, පුද්ගල හා ප්‍රජා සංවර්ධනය, මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තුව යන ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛතාවය ලබාදෙමින් දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳ පොළ ඉල්ලුමට සරිලන ලෙස පුහුණුලාභින් 33,887 පූර්ණ කාලීන හා අර්ධ කාලින වශයෙන් පුහුණු කිරීම මගින් ජාතික ආර්ථිකයට දායක වීම.
- පුහුණුකරුවන් පුහුණු කිරිමේ පාසලක් ආරම්භ කිරීම.
- පැස්සුම් ක්ෂේත්‍රයේ එක් පාඨමාලාවක්,මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ එක් පාඨමාලාවක්, මෙකාට්‍රොනික් ක්ෂේත්‍රයේ එක් පාඨමාලාවක් හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පාඨමාලා 06ක් ජාතික සුදුසුකම් 05 මට්ටමේ ජාතික ඩිප්ලෝමා පාඨමාලා ලෙස ආරම්භ කිරීමට සැලසුම් කිරීම.
- 2012 වර්ෂයේ වෘත්තීය පුහුණුව ලැබූ පුහුණුලාභීන් 8,025 ක් රැකියා ගත කිරිමට සැලසුම් කිරීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් සඳහා නිපුණතා පාදක පුහුණු ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක කරනු ලබන පාඨමාලා 170 ක් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ප්‍රතීතනය කර ගැනීම.
- කොරියානු රජය මගින් ලබාදෙන ණය ආධාර යටතේ ඔරුගොඩවත්ත ජාතික වෘත්තීය පුහුණු ආයතනය විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථානයක් **(Center of Excellence)** ලෙස සංවර්ධනය කිරීම.
- මන්නාරම දිස්ත්‍රික්කයේ UNICEF ආධාර මත නව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශනය පිළිබඳ වැඩ සටහන් 2,500කට ආසන්න ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීම.
- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 50ක් පැවැත්වීම.

- පෞද්ගලික අංශයේ ප්‍රමුඛ සමාගම් හා එක්ව ශිල්පීය දක්ෂතා වැඩි දියුණු කිරිමේ වැඩසටහන් 40 ක් පැවැත්වීම .
- සිංගප්පූරු ජනරජයේ පොලිටෙක්නික් ජාත්‍යන්තර ආයතනයේ අනුග්‍රහය යටතේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 2 ක් ක්‍රියාත්මක කිරිම මඟින් පුහුණුකරුවන් 60 දෙනෙක් ගැටළු පාදක පුහුණු ක්‍රමවේදය පිළිබඳව පුහුණු කිරීම.
- රණවිරු සේවා අධිකාරිය හා ඒකාබද්ධව ආබාධිත රණවිරුවන් සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කර පුහුණු පාඨමාලා පවත්වාගෙන යාම.
- 2013 වර්ෂය තුළදී ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පත්‍ර 11500 ක් ප්‍රදානය කිරීම.
- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පවත්වා ස්වයං රැකියාවන් හි නියැලීමට අපේක්ෂිත ආධුනිකයින් 200 දෙනෙකු සඳහා රාජ්‍ය බැංකු සම්බන්ධ කරගෙන ණය පහසුකම් ලබාදීම.
- මානව සම්පත් සංවර්ධනය කිරිම යටතේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් 31 හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් 45 පැවැත්වීම.

කර්නල් එස්. ආර්. පී .රත්නායක (ආර්ඩබ්පී,ආර්එස්පී)
සභාපති
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

## 02. හැඳින්වීම

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ස්ථාපිත කරන ලදී.

## 03. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ව්‍යුහය.

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනතේ 5 වන වගන්තියට අනුව පත්කරනු ලබන සභාපතිවරයකු, උප සභාපතිවරයකු ඇතුළු සාමාජිකයන් 12 දෙනෙකුගෙන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාලක මණ්ඩලය සමන්විත වේ.

2012.01.01 සිට 2012.08.30 දක්වා පහත සදහන් පාලක මණ්ඩලය ක්‍රියාත්මකව පැවතිණි.

| | | |
|---|---|---|
| 1 | නීතිඥ ධම්මික හේවාපතිරණ මහතා<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | සභාපති |
| 2 | නීතිඥ ලෙස්ලි වීරමන්ත්‍රී මහතා<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | උප සභාපති |
| 3 | පී.රණේපුර මහතා<br>අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | සාමාජික |
| 4 | එච්.එන්.එන්. ගුණසේකර මහත්මිය<br>අධ්‍යක්ෂ (සැලසුම්), කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | සාමාජික |
| 5 | කේ.එම්. එම්.සිරිවර්ධන මහතා<br>අධ්‍යක්ෂ ජෙනරාල්<br>රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | සාමාජික |
| 6 | ආචාර්ය තිස්ස ජිනසේන මහතා<br>සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | සාමාජික |
| 7 | ඒ.ආර්. දේශප්‍රිය මහතා<br>අතිරේක ලේකම් (වෘත්තිය පුහුණු)<br>යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | සාමාජික |

| | | |
|---|---|---|
| 8 | නිමල් වීරතුංග මහතා<br>මාධ්‍ය ලේකම්<br>යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | සාමාජික |
| 9 | කේ.සී.ජ්. අරුණදේව සිල්වා මහතා<br>සම්බන්ධීකරණ ලේකම්<br>යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | සාමාජික |
| 10 | උදය හිත්තැටියගේ මහතා<br>කළමනාකාර අධ්‍යක්ෂ, ඩී.ඊ. ටෙක්නොලොජීස්. | සාමාජික |
| 11 | නිතීඥ කිර්ති කලුආරච්චි මහතා<br>නිතීඥ හා ප්‍රසිද්ධ නොතාරිස් | සාමාජික |
| 12 | එම්.ඩී .සී අමරතුංග මහතා<br>අතිරේක කම්කරු කොමසාරිස් ජෙනරාල්<br>කම්කරු දෙපාර්තමේන්තුව | සාමාජික |

2012 වර්ෂයේදී පවත්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව **06**

## විගණන හා කළමණාකරණ කමිටු සාමාජිකයින්

| | | |
|---|---|---|
| 1 | කේ.එම්.එම් සිරිවර්ධන මහතා | සභාපති |
| 2 | හේරත් යාපා මහතා | සාමාජික |
| 3 | නිමල් වීරතුංග මහතා | සාමාජික |

2012 වර්ෂයේ පවත්වා ඇති විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව **02**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි ලෙස සභාපතිතුමා කටයුතු කරන අතර, ඔහුගේ සහාය සඳහා උප සභාපති වරයෙකු, අධ්‍යක්ෂවරුන් 5 දෙනෙකු ඇතුළු නිලධාරීන් 1,740 දෙනෙකුගෙන් සමන්විත කාර්යය මණ්ඩලයක් ඇත.ඒ අනුව 2012 වර්ෂයේ සේවයේ යෙදී සිටින ලද කාර්ය මණ්ඩලය අතුරින් ජ්‍යෙෂ්ඨ හා මධ්‍යම කළමනාකරණ මට්ටම දක්වා වූ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

| | |
|---|---|
| සභාපති : | කර්නල් එස්.ආර්. පී .රත්නායක (ආර්ඩබ්පී,ආර්එස්පී),(2012.09.07 දින සිට) |
| | නීතිඥ ධම්මික හේවාපතිරණ (2012.08.30 දින දක්වා) |
| උප සභාපති : | නීතිඥ ලෙස්ලි වීරමන්ත්‍රී (2012.09.03 දින දක්වා) |
| අධ්‍යක්ෂවරු : | 1. කේ.ජේ.කෝරළගේ මහතා<br>2. ඩබ්.ඩී. ප්‍රනාන්දු මහතා (වැ.බ.) (2012.06.01 දින සිට)<br>3. ඩබ්.ඒ. රණවීර මහතා (වැ.බ.) (2012.11.06 දින සිට)<br>4. සී.පී. ලොකුගලප්පත්ති මහතා (වැ.බ.) (2012.09.11 දින සිට)<br>5. එල්.පී.මනෝජා එස්.පතිරණ මෙනවිය (වැ.බ.) (2012.09.19 දින සිට)<br>6. සී.විදානපතිරණ මහතා (2012.04.25 දින විශ්‍රාම ගොස් ඇත)<br>7. ජී.එම්.පී.ඒ.ගල්ලබ මහතා (2012.03.01 දින සේවයෙන් ඉවත්වී ඇත)<br>8. එන්. කේ. ජේ.ද. සිල්වා මහතා(2012.11.05දින විශ්‍රාම ගොස් ඇත) |
| නියෝජ්‍ය අධ්‍යක්ෂවරු | 1. කේ.සරත් ආනන්ද මහතා<br>2. එන්.එස්.ඩී.නවරත්න මහතා (වැ.බ.) (2012.07.05දින සිට)<br>3. එන්.කේ.ඉලේසිංහ මහතා (වැ.බ.) (2012.05.17 දින සිට)<br>4. මහින්ද ජයතිලක මහතා (2012.06.01 විශ්‍රාම ගොස් ඇත)<br>5. සම්පත් අබේගුණසේකර මහතා (වැ.බ.) (2012.03.12 දින ඉල්ලා අස් වී ඇත.) |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1. එච්.යූ. කාරියවසම් මහතා |
| ව්‍යාපෘති සම්බන්ධිකාරක | 1. සී. ආර්. සමරවීර මහතා (2012.04.12 දින දක්වා) |
| විශේෂඥ උපදේශක | 1. ජී බාලචන්ද්‍රන් මහතා (තොරතුරු තාක්ෂණය) (2012.01.02 සිට 2012.11.12 දක්වා)<br>2. ඩී.පී.එල්. ආර්.එච්.මාගෙදර මහතා (2012.04.16 සිට (2012.11.12 දක්වා) |

සහකාර අධ්‍යක්ෂවරු

1. එන්. ඩී.පී. ධම්මික මහතා
2. ඩබ්.ඩබ්. සොයිසා මහතා (2012.08.05 විශ්‍රාම ගොස් ඇත )
3. ඩී.ආර්.එස්.එල්. දසනායක මහතා
4. යූ.කේ.නන්ද මහතා
5. එච්. ඩබ් .ආර්. පී. විජේසේකර මහතා
6. පී.එම්. පෙරේරා මහතා
7. ටී.ඩී.එස්. සංසදාස මහතා
8. ඒ.කේ.ආරච්චිගේ මහතා
9. ඩබ් ජී විජේරත්න මහතා
10. ටී.විනෝදරාජා මහතා
11. ඒ.ඒ. ජබීර් මහතා
12. ජී.වී.පී.එන්. පෙරේරා මහතා
13. ර්.ඒ.ඩී.එස්.සේනාරත්න මහතා
14. එච්. ඩබ්. රොහාන් ප්‍රියන්ත මහතා (වැ.බ.)
15. ඒ. එම්. ඒ. ජයතිස්ස මහතා
16. ජී. ඩී. ජයසිංහ මහතා
17. ආර්. එන්. කේ. එම්. ජේ. සෙනෙවිරත්න මහතා
18. වි.පී. නිමල්සිරි මහතා (වැ.බ.)
19. එම්. පී. ටී. රත්නායක මහතා(කොන්ත්‍රාත්)
(2012.04.01ඉල්ලා අස්වී ඇත)
20. පී. ආර්. එම්. සී. කුලතුංග මිය (වැ.බ.)
21. කේ. ඒ. ලලිතධීර මහතා (වැ.බ.)
22. එච්.පි මනම්පේරි මහතා (වැ.බ.)
23. ආර්. එම්.ආර්. රත්නායක මහතා(වැ.බ.) (2012.06.01 දින සිට)
24. ඩී.ඒ.එස් අතුකෝරාල මහතා (වැ.බ.) (2012.05.17 දින සිට)
25. එච්.ටී.ඩී ආර් එස් විජේසිංහ මහතා (වැ.බ.)( 2012.05.15 දින සිට)
26. එච්.ටී.ඒස් වික්‍රමරත්න මහතා (වැ.ආ)
27. පී.එන්.අබේසිංහ මහතා (වැ.ආ)
28. පී.එල්.ඒ පීරිස් මහතා (වැ.ආ)

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් / නීති නිලධාරි

1. ඒ.ඒ.එච්.අයි.අමරතුංග මිය

## කාර්යය මණ්ඩල තොරතුරු 2012.12.31 දක්වා

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා 2012 වර්ෂයට අනුමත කාර්ය මණ්ඩලය 1,928 කි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව 2012.12.31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව 1,740 කි.

| | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය | වර්ෂය අවසානයේ පුරප්පාඩු/ අතිරික්ත |
|---|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජෙනරාල් | 1 | 1 | 0 |
| 2. | අධ්‍යක්ෂ | 5 | 4 | 1 |
| 3. | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 5 | 3 | 2 |
| 4. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| 5. | සහකාර අධ්‍යක්ෂ | 25 | 17 | 8 |
| 6. | ජ්‍යෙෂ්ඨ පුහුණු කළමනාකරු | 10 | 4 | 6 |
| 7. | අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් / නීති නිලධාරී | 1 | 1 | 0 |
| 8. | ගණකාධිකාරී | 2 | 0 | 2 |
| 9. | පුහුණු කළමනාකරු | 38 | 26 | 12 |
| 10. | පරිපාලන නිලධාරී | 1 | 1 | 0 |
| 11. | ලේකම් | 5 | 6 | -1 |
| 12. | කළමනාකරු (ප්‍රවාහන) | 1 | 0 | 1 |
| 13. | කළමනාකරු (සැපයුම්) | 1 | 1 | 0 |
| 14. | කළමනාකරු (මුද්‍රණ) | 1 | 1 | 0 |
| 15. | විගණන නිලධාරී | 1 | 1 | 0 |
| 16. | පද්ධති විශ්ලේෂක | 1 | 0 | 1 |
| 17. | පුහුණු නිලධාරී | 33 | 25 | 8 |
| 18. | පර්යේෂණ නිලධාරී | 2 | 2 | 0 |
| 19. | සැළසුම් නිලධාරී | 2 | 2 | 0 |
| 20. | පරීක්ෂණ හා ඇගයීම් නිලධාරී | 3 | 0 | 3 |
| 21. | විමර්ෂණ නිළධාරී | 1 | 1 | 0 |
| 22. | ගිණුම් සහකාර | 22 | 27 | -5 |
| 23. | විගණන සහකාර | 4 | 3 | 1 |
| 24. | වැඩසටහන් නිලධාරී | 42 | 27 | 15 |
| 25. | වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරී | 13 | 10 | 3 |

| | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය | වර්ෂය අවසානයේ පුරප්පාඩු/ අතිරික්ත |
|---|---|---|---|---|
| 26. | රැකියාගත කිරීමේ නිලධාරී | 24 | 17 | 7 |
| 27. | ජ්‍යෙෂ්ඨ උපදේශක | 26 | 24 | 2 |
| 28. | ව්‍යාපෘති සහකාර | 115 | 34 | 81 |
| 29. | ප්‍රධාන ගබඩා නිලධාරී | 1 | 1 | 0 |
| 30. | ප්‍රධාන ලිපිකරු | 2 | 2 | 0 |
| 31. | අධීක්ෂක (මුද්‍රණ) | 1 | 1 | 0 |
| 32. | ගොඩනැගිලි අධීක්ෂක | 1 | 0 | 1 |
| 33. | නේවාසිකාගාර පාලක | 2 | 1 | 1 |
| 34. | උපදේශක | 1179 | 1159 | 20 |
| 35. | ලඝු / යතුරු ලේඛක | 5 | 4 | 1 |
| 36. | ගබඩා නිලධාරී | 24 | 22 | 2 |
| 37. | ලිපිකරු / යතුරු ලේඛක | 88 | 76 | 12 |
| 38. | ගිණුම් ලිපිකරු | 23 | 24 | -1 |
| 39. | විගණන ලිපිකරු | 3 | 1 | 2 |
| 40. | මුදල් අයකැමි | 1 | 1 | 0 |
| 41. | පරිගණක ක්‍රියාකරු | 5 | 5 | 0 |
| 42. | අකුරු අමුණන්නා (මුද්‍රණ) | 1 | 1 | 0 |
| 43. | පිළිගැනීමේ නිලධාරී/දුරකථන ක්‍රියාකරු | 2 | 2 | 0 |
| 44. | යන්ත්‍ර ක්‍රියාකරු (මුද්‍රණ) | 1 | 1 | 0 |
| 45. | පොත් බඳින්නා (මුද්‍රණ) | 1 | 1 | 0 |
| 46. | මුද්‍රණ සහකාර | 3 | 2 | 1 |
| 47. | රියදුරු | 32 | 32 | 0 |
| 48. | කා.කා.ස. | 3 | 4 | -1 |
| 49. | මුරකරු | 72 | 64 | 8 |
| 50. | ගබඩාකරු | 3 | 2 | 1 |
| 51. | කම්කරු+ සනීපාරක්ෂක කම්කරු | 89 | 95 | -6 |
| | **එකතුව** | **1928** | **1740** | **188** |

| | | | | |
|---|---|---|---|---|
| | සහකාර උපදේශක | | 39 | |

## වැඩ බලන හා කොන්ත්‍රාත් පදනමින් සේවය කළ කාර්ය මණ්ඩලය

ඉහත 1740 ක් වන කාර්යය මණ්ඩලය තුළ ඉහත සඳහන් පරිදි වැඩ බලන හා කොන්ත්‍රාත් පත්වීම් ක්‍රියාත්මක විය.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | තනතුරු ස්වාභාවය |
|---|---|---|
| අධ්‍යක්ෂ | 04 | වැඩබලන |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 02 | වැඩබලන |
| සහකාර අධ්‍යක්ෂ | 08 | වැඩබලන |
| පුහුණු කළමනාකරු | 07 | වැඩබලන |
| ජ්‍යෙෂ්ඨ පුහුණු කළමනාකරු | 01 | වැඩබලන |
| විමර්ෂණ නිළධාරි | 01 | පැවරුම් පදනම |
| ප්‍රවාහන කළමණාකරු | 01 | වැඩබලන |
| ප්‍රධාන ගබඩා නිළධාරී | 01 | වැඩබලන |
| රැකියා ගත කිරීමේ නිළධාරී | 01 | වැඩබලන |
| ගණකාධිකාරි | 01 | වැඩබලන |
| සහකාර ගණකාධිකාරි | 01 | කොන්ත්‍රාත් |
| උපදේශක | 587 | කොන්ත්‍රාත් |
| ලිපිකරු / යතුරු ලේඛක | 05 | කොන්ත්‍රාත් |
| මුරකරු | 15 | කොන්ත්‍රාත් |
| කම්කරු | 38 | කොන්ත්‍රාත් |

## 04. කාර්යය මණ්ඩලය පුහුණු කිරීම.

2012 වර්ෂය සඳහා කාර්යය මණ්ඩලය පුහුණු කිරීමේ කටයුතු වෙනුවෙන් විශේෂ අවධානයක් යොමුකළ අතර, කාර්යය මණ්ඩලයේ දැනුම, ආකල්ප හා කුසලතාව වැඩි දියුණු කිරීමේ අරමුණින් සංවිධානය කල පුහුණු වැඩසටහන් තුලින් නිලධාරින් 27 දෙනෙකු විදේශීය පුහුණු වැඩසටහනක සඳහා ද, නිලධාරීන් 1,234 දෙනෙකු දේශීය පුහුණු වැඩසටහන් සඳහා ද සහභාගී කරවන ලදී.

එක් එක් කාණ්ඩයන් හි නිලධාරීන් බොහෝ විට දේශීය පුහුණු වැඩසටහන් දෙකකට වඩා සහභාගී වූහ. මෙම නිලධාරීන් අතුරින් 1,151 දෙනෙකු අධ්‍යයන කාර්යය මණ්ඩලයට අයත් නිලධාරීන් වන අතර, 83 දෙනෙකු අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් වෙති.

ඒ ඒ පුහුණු වැඩසටහන් පිලිබඳ විස්තර පහතින් දැක්වේ.

### විදේශීය පුහුණුව 2012

| | ශිෂ්‍යත්වය | රට | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | P B L ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | සිංගප්පුරුව | 01 |
| 2 | මැලේසියානු හා ශ්‍රී ලංකා නිපුණතා සංවර්ධන උපාය මාර්ග හුවමාරු කරගැනිමේ වැඩසටහන | මැලේසියාව | 01 |
| 3 | ජාත්‍යන්තර නිපුණතා සාමාජික වැඩ සටහන | දකුණු කොරියාව | 01 |
| 4 | කළමණාකරණ පුහුණු ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | සිංගප්පුරුව | 05 |
| 5 | වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | සිංගප්පුරුව | 05 |
| 6 | HMTI ව්‍යාපෘතිය යටතේ ඒ ඒ ක්ෂේත්‍ර සඳහා විශේෂ පුහුණුව | ඉන්දියාව | 10 |
| 7 | ආසියානු රටවල් සඳහා පුහුණු සුදුසුකම් අනුමත කිරීමේ වැඩසටහන | දකුණු කොරියාව | 01 |
| 8 | දෘශ්‍යාබාධිතයන් පුහුණු කිරීම සම්බන්ධ වැඩසටහන | ස්වීඩනය | 01 |
| 9 | වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා පුහුණු වැඩසටහන | දකුණු කොරියාව | 02 |
| | **එකතුව** | | **27** |

## දේශීය පුහුණුව (අධ්‍යයන කාර්ය මණ්ඩලය ) – 2012

| | පුහුණු ක්ෂේත්‍රය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පුහුණු ක්‍රමවේදය පිළිබඳ උපදේශකවරුන් පුහුණු කිරීම | 692 |
| 02 | ආකල්ප සංවර්ධන වැඩසටහන | 77 |
| 03 | විද්‍යුත් ඉගෙනුම් ආධාරක සඳහා රූපගත කිරීමේ වැඩසටහන | 10 |
| 04 | ගැටළු පාදක පුහුණු වැඩසටහන | 209 |
| 05 | නව උපදේශකවරුන් සඳහා පුහුණු වැඩසටහන | 110 |
| 06 | **CNC** යන්ත්‍ර පුහුණු වැඩසටහන | 07 |
| 07 | තත්ව පාලක වැඩමුළුව | 46 |
| | **එකතුව** | **1,151** |

## දේශීය පුහුණුව (අනධ්‍යයන කාර්ය මණ්ඩලය ) - 2012

| | පුහුණු වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අභිමානවත් රාජ්‍ය සේවයක් සඳහා ධනාත්මක ආකල්ප සංවර්ධනය | 27 |
| 02 | මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති | 02 |
| 03 | මානව සම්පත් කළමනාකරණය | 01 |
| 04 | අයකැමිගේ වගකීම සහ භූමිකාව | 01 |
| 05 | පරිගණක චිත්‍ර | 02 |
| 06 | විලාසිතා ආභරණ නිෂ්පාදන කර්මාන්ත පුහුණුව | 01 |
| 07 | Tai Ichi ona's seven wastes | 01 |
| 08 | හරිත ඵලදායීතාව හඳුන්වාදීම. | 01 |
| 09 | වැටුප් ලේඛන කළමනාකරණ පුහුණුව | 01 |
| 10 | රාජ්‍ය ගිණුම්කරණය | 06 |
| 11 | ඇගයීම් හා ප්‍රමිතීන් පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය | 02 |
| 12 | විනය කළමණාකරණය | 02 |
| 13 | වෘත්තීය ආතති කළමණාකරණය | 01 |
| 14 | කාර්ය කළමණාකරණ පුහුණුව | 15 |
| 15 | රාජ්‍ය නිළධාරින්ගේ හැකියා වර්ධන පුහුණුව | 05 |
| 16 | කළමණාකරණ සහකාර නිළධාරින් පුහුණුව | 15 |
| | **එකතුව** | **83** |

## 05.වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබා දීම

දිවයින පුරා පිහිටුවා ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 274 තුලින් වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර 15 ක් යටතේ පුහුණු පාඨමාලා 112 ක් ක්‍රියාත්මක කරන ලදී.ඒ අනුව 2012 වර්ෂයේදී ආධුනිකයින් 32,855ක් පුහුණුව සඳහා බඳවා ගන්නා ලද අතර, ඉන් ආධුනිකයින් 27,469 ක් පුහුණු අවසන් කරන ලදී. මෙම සංඛ්‍යාවට ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් හා කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා බඳවා ගන්නා ලද ආධුනිකයින්ද ඇතුලත් කර ඇත

### වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වීම/පිටවීම

| වර්ෂය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| පුහුණුවට ඇතුලත් වූ සංඛ්‍යාව | 28,445 | 33,792 | 32,855 |
| පුහුණුව අවසන් කළ සංඛ්‍යාව | 24,537 | 30,077 | 27,469 |



**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ පූර්ණකාලීන හා අර්ධකාලීන පාඨමාලා 2012**

| ක්ෂේත්‍රය | පාඨමාලාව හා කාලය | ඇතුලත් වූ ආධුනික සංඛ්‍යාව | පුහුණුව අවසන් කල ආධුනික සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1. ඉදිකිරීම් ශිල්පි (මාස 06) | 833 | 741 |
| | 2. ඉදිකිරීම් තාක්‍ෂණ ශිල්පී | 23 | 18 |
| | 3. ප්‍රමාණ සමීක්‍ෂණ ඩිප්ලෝමාව | 94 | 86 |
| | 4. සැලසුම් ශිල්පි | 218 | 193 |
| | 5. ජල නල කාර්මික (මාස 06) | 501 | 437 |
| | 6. ප්‍රමාණ සමීක්‍ෂක | 18 | 16 |
| | 7. Auto cad | 19 | 19 |
| | | **1706** | **1510** |
| 2.විද්‍යුත් සහ සන්නිවේදය | 1. උපකරණ තාක්‍ෂණ ශිල්පී (මාස 12) | 22 | 13 |
| | 2. ජංගම දුරකථන අලුත්වැඩියා ශිල්පී (මාස 06) | 67 | 66 |
| | 3. කාර්යාල උපකරණ කාර්මික | 13 | 12 |
| | 4. ගුවන් විදුලි රූපවාහිනි ආශ්‍රිත උපකරණ අලුත්වැඩියා ශිල්පී (මාස 12) | 225 | 172 |
| | 5. විදුලි මෝටර් පාලක | 13 | 13 |
| | 6. විදුලි කාර්මික | 68 | 68 |
| | 7. ගෘහස්ථ විදුලි කාර්මික | 12 | 12 |
| | | **420** | **356** |
| 3. කෘෂි කාර්මික හා සත්ව පාලනය | 1. මල් හා විසිතුරු පැල (මාස 06) | 43 | 36 |
| | 2. තවාන් පාලනය හා පැල බද්ධකරු (මාස 06) | 12 | 12 |
| | | **55** | **48** |

| | | | |
|---|---|---|---|
| 4.ස්වයං චලන (මෝටර් යන්ත්‍රක) | 1. කෘෂි උපකරණ කාර්මික (මාස 06) | 83 | 72 |
| | 2. මෝටර් රථ වායු සමීකරණ ශිල්පී (මාස 06) | 161 | 142 |
| | 3. මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී (මාස 12) | 187 | 153 |
| | 4. මෝටර් රථ කාර්මික (මාස 06) | 697 | 597 |
| | 5. මෝටර් රථ පින්තාරු ශිල්පී (මාස 06) | 137 | 126 |
| | 6. මෝටර් රථ වැද්දුම් ශිල්පී (මාස 06) | 114 | 103 |
| | 7. රියදුරු - බර වාහන (මාස 03) | 350 | 330 |
| | 8. ගොවිපල උපකරණ කාර්මික | 15 | 15 |
| | 9. යතුරුපැදි කාර්මික ශිල්පී | 732 | 605 |
| | 10. මෝටර් රථ තාකෂණ ශිල්පී | 16 | 16 |
| | 11. ත්‍රිරෝද රථ කාර්මික ශිල්පී(මාස 06) | 589 | 555 |
| | | **3081** | **2714** |
| 5.තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය | 1. ජාතික තොරතුරු තාක්‍ෂණික සහතික පත්‍ර පාඨමාලාව (මාස 06) | 1627 | 1499 |
| | 2. වෘත්තිය සහතික පත්‍ර පාඨමාලාව (ඇඩෝබ්) (මාස 06) | 23 | 21 |
| | 3. ජාතික තොරතුරු හා සන්නිවේදන ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාව (මාස12) | 411 | 352 |
| | 4. CISCO පරිගණක ජාල පාඨමාලාව (මාස12) | 72 | 64 |
| | 5. පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී(ආබාධිත) (මාස 06) | 72 | 70 |
| | 6. පරිගණක දෘඩාංග ශිල්පී A+(මාස 06) | 293 | 265 |
| | 7. පරිගණක දෘඩාංග ශිල්පී (මාස 06) | 718 | 633 |
| | 8. තොරතුරු තාක්‍ෂණ ශිල්පී (ආබාධිත) (මාස 06) | 13 | 11 |
| | 9. පරිගණක යෙදවුම් සහායක | 12 | 12 |
| | 10.පරිගණක පාදක මෘදුකාංග | 878 | 870 |

| | | | |
|---|---|---|---|
| | 11. නවකයින් සඳහා මූලික පරිගණක දැනුම | 43 | 43 |
| | 12. රාජ්‍ය සේවකයින් සඳහා විශේෂ පරිගණක පුහුණුව | 74 | 74 |
| | 13. පරිගණක සාක්ෂරතා විශේෂ වැඩසටහන | 121 | 121 |
| | 14. IC3 | 365 | 355 |
| | 15.MS Office | 13 | 12 |
| | 16. තොරතුරු තාක්ෂණ ශිල්පී (මාස 06) | 2358 | 2180 |
| | | **7093** | **6582** |
| 6. මුද්‍රණය | 1. ලිතෝ මැෂින් ඔපරේටර් (මාස 12) | 36 | 31 |
| | 2. පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී(මාස 06) | 249 | 231 |
| | | **285** | **262** |
| 7.හෝටල් හා සංචාරක කර්මාන්තය | 1. සූපවේදී (මාස 06) | 1035 | 902 |
| | 2. කාමර සේවක (මාස 06) | 357 | 320 |
| | 3. භෝජනාගාර සේවක (මාස 06) | 294 | 259 |
| | | **1686** | **1481** |
| 8.ලෝහ ආශ්‍රිත | 1. පිත්තල වාත්තු/කැටයම් ශිල්පී (මාස 06) | 11 | 11 |
| | 2. ලෝහ පිරිසැකසුම්කරු (මාස 12) | 57 | 51 |
| | 3. වෑද්දුම්කරු (සාමාන්‍යය) (මාස 12) | 37 | 36 |
| | 4. යන්ත්‍ර ශිල්පී (සාමාන්‍යය) (මාස 12) | 240 | 189 |
| | 5. පෑස්සුම් ශිල්පී (මාස 12) | 29 | 26 |
| | 6. පෑස්සුම් ශිල්පී (මාස 06) | 861 | 755 |
| | 7. ඇලුමිනියම් පිරිසැකසුම් කාර්මික | 768 | 655 |
| | 8. CNC Milling | 23 | 23 |
| | | **2026** | **1746** |

| | | | |
|---|---|---|---|
| 9. මැණික් හා ස්වර්ණාභරණ | 1. මැණික් කැපුම් ශිල්පී (මාස 06) | 16 | 14 |
| | 2. ස්වර්ණාභරණ කාර්මික (මාස 12) | 79 | 66 |
| | 3. ස්වර්ණාභරණ ගල් අල්ලන්නා(මාස 06) | 24 | 20 |
| | | **119** | **100** |
| 10. දැව ආශ්‍රිත නිෂ්පාදන | 1. ලී කැටයම් ශිල්පී (මාස 06) | 36 | 22 |
| | 2. ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) | 776 | 674 |
| | 3. ලී වැඩ කාර්මික ශිල්පී (ගොඩනැගිලි) | 114 | 78 |
| | 4. දැව භාණ්ඩ නිෂ්පාදනය (මාස 12) | 184 | 144 |
| | | **1110** | **918** |
| 11.රෙදිපිළි හා ඇඟළුම් | 1. ෆැබ්රික් කටර් (මාස 03) | 11 | 11 |
| | 2. ඇඟළුම් නිෂ්පාදන සුපරීක්ෂක (මාස 06) | 52 | 43 |
| | 3. ඇඟළුම් තත්ව පාලක (මාස 06) | 253 | 217 |
| | 4. අධිවේගී මහන යන්ත්‍ර කාර්මික (මාස 06) | 262 | 230 |
| | 5. අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු (මාස 03) | 987 | 962 |
| | 6. මෝස්තර නිර්මාණ ශිල්පී (මාස 06) | 195 | 173 |
| | 7. තිර මුද්‍රණ ශිල්පී (මාස 06) | 193 | 157 |
| | 8. ඇඳුම් මැසීම (පිරිමි) (මාස 06) | 289 | 255 |
| | 9. ඇඳුම් මැසීම (ගැහැණු) (මාස 06) | 2165 | 1844 |
| | 10. වැඩ අධ්‍යයන සහායක (මාස 06) | 38 | 31 |
| | | **4445** | **3923** |
| 12. විදුලි | 1. ශීතකරණ හා වායු සමීකරණ ශිල්පී (මාස 12) | 542 | 448 |
| | 2. ගෘහ විදුලි උපකරණ අළුත්වැඩියා කරන්නා | 79 | 54 |
| | 3. විදුලි මෝටර් එතුම් ශිල්පී | 385 | 322 |
| | 4. විදුලි ශිල්පී (මාස 06, මාස 12) | 2391 | 1987 |
| | | **3397** | **2811** |

| | | | |
|---|---|---|---|
| 13. කාර්මික කළමණාකරණය | 1. කාර්මික කළමණාකරණ ඩිප්ලෝමා (මාස 06) | 20 | 20 |
| | | **20** | **20** |
| 14. රබර්, ප්ලාස්ටික් හා සම්භාණ්ඩ ආශ්‍රිත නිෂ්පාදන | 1. සම් භාණ්ඩ නිෂ්පාදක(බෑග්) (මාස 06) | 16 | 14 |
| | 2. සම් පාවහන් නිෂ්පාදක | 54 | 50 |
| | | **70** | **64** |
| 15. පුද්ගල හා සමාජීය සංවර්ධනය | 1. රූපලාවන්‍යය (මාස 03) | 1477 | 1360 |
| | 2. කොණ්ඩා කැපුම් ශිල්පී (පිරිමි) (මාස 06) | 29 | 22 |
| | 3. කොණ්ඩා මෝස්තර ශිල්පී (මාස 03) | 1147 | 1089 |
| | 4. පැණිරස කෑම නිෂ්පාදනය | 8 | 8 |
| | 5. බිම්මල් වගාකරු | 10 | 10 |
| | 6. ඉංගිසි භාෂාව | 76 | 76 |
| | 7. උද්‍යාන අලංකරණ ශිල්පී | 241 | 211 |
| | | **2988** | **2776** |
| 16.ධීවර | 1. මෝටර් බෝට්ටු කාර්මික | 86 | 79 |
| | | **86** | **79** |
| 17.කාර්යාල කළමණාකරනය | 1. ලේඛම් පරිචය | **64** | 56 |
| | | **64** | **56** |
| 18.ආහාර තාක්ෂණය | 1. බේකරි ශිල්පී | 362 | 305 |
| | 2. පළතුරු සහ එළවළු නිෂ්පාදන සැකසුම්කරු | 51 | **48** |
| | | **413** | **353** |
| | එකතුව | **29,064** | **25,799** |

## වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර ඉල්ලුම - 2012

| ක්ෂේත්‍රය | ඇතුලත් වූ ආධුනික සංඛ්‍යාව |
|---|---|
| 1. ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1706 |
| 2. විද්‍යුත් සහ සන්නිවේදනය | 420 |
| 3. කෘෂි කාර්මික හා සත්ව පාලනය | 55 |
| 4. ස්වයං චලන (මෝටර් යන්ත්‍රක) | 3081 |
| 5. තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය | 7093 |
| 6. මුද්‍රණය | 285 |
| 7. හෝටල් හා සංචාරක කර්මාන්තය | 1686 |
| 8. ලෝහ ආශ්‍රිත | 2026 |
| 9. මැණික් හා ස්වර්ණාභරණ | 119 |
| 10. දැව ආශ්‍රිත නිෂ්පාදන | 1110 |
| 11. රෙදිපිළි හා ඇඟළුම් | 4445 |
| 12. විදුලි | 3397 |
| 13. කාර්මික කළමණාකරනය | 20 |
| 14. රබර්, ප්ලාස්ටික් හා සම්භාණ්ඩ ආශ්‍රිත නිෂ්පාදන | 70 |
| 15. පුද්ගල හා සමාජීය සංවර්ධනය | 2988 |
| 16. ධීවර | 86 |
| 17. කාර්යාල කළමණාකරනය | 64 |
| 18. ආහාර තාක්ෂණය | 413 |
| **එකතුව** | **29,064** |

## ක්ෂේත්‍රයන් සඳහා පැවති ඉල්ලුම 2012




## මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු

| වර්ෂය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | 236 | 232 | 244 |
| දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | 22 | 23 | 22 |
| ජාතික වෘත්තීය පුහුණු ආයතන | 06 | 06 | 08 |
| එකතුව | 264 | 261 | 274 |



# 06. පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය හා ආධුනික සංඛ්‍යාව - 2012

| | | ආධුනික සංඛ්‍යාව | සමස්ථයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| 1. | බස්නාහිර පළාත | - 6131 | 21% |
| 2. | දකුණු පළාත | - 6601 | 23% |
| 3. | ඌව පළාත | - 1774 | 6% |
| 4. | සබරගමුව පළාත | - 2330 | 8% |
| 5. | වයඹ පළාත | - 2483 | 9% |
| 6. | උතුරු මැද පළාත | - 2076 | 7% |
| 7. | නැගෙණහිර පළාත | - 3183 | 11% |
| 8. | උතුරු පළාත | - 1733 | 6% |
| 9. | මධ්‍යම පළාත | - 2753 | 9% |
| | | **29064** | |



## 07. වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශන වැඩසටහන් පැවැත්වීම.

දිවයින පුරා පිහිටුවා ඇති වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ඒකක මගින් තරුණ තරුණියන් හට ඔවුන්ගේ රුචිකත්වය හා සුදුසුකම් මත ගැළපෙන වෘත්තීය ක්ෂේත්‍රය තෝරා ගැනීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟ පෙන්වනු ලැබේ.

මෙම වැඩසටහන් වලට අනුව 2012 වසරේ දී පාසැල් සිසුන්, පාසැල් හැරයන සිසුන්, යෞවන සමාජ සිසුන්,පුහුණු වන්නන්, ක්ෂේත්‍ර නිලධාරීන්, ගුරුවරුන්, යොවුන් සේනාංක සිසුන් හා නිපුණතා බලකා සිසුන්ලෙස වැඩසටහන් 2,441 ක් මගින් 121,452 දෙනෙකු දැනුවත් කිරීමට හැකිවිය.

### වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2012

| ඉලක්ක ගත කණ්ඩායම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| පාසැල් සිසුන් | 464 | 32456 |
| පාසැල් හැරයන්නන් | 307 | 13087 |
| යෞවන සමාජ සිසුන් | 139 | 9293 |
| පුහුණු වන්නන් | 415 | 14878 |
| ක්ෂේත්‍ර නිලධාරීන් | 662 | 29009 |
| ගුරුවරු | 54 | 2227 |
| යොවුන් සේනාංක සිසුන් | 50 | 3492 |
| නිපුනතා බලකාය සිසුන් | 22 | 1926 |
| පෙර පුහුණු වැඩසටහන් | 328 | 15081 |
| **එකතුව** | **2,441** | **121,452** |

### වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම

| වර්ෂය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| සහභාගී වූ සංඛ්‍යාව | **97,736** | **108,607** | **121,452** |



## 08. රැකියාගත කිරීම.

දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන රැකියා ගත කිරීමේ වැඩපිළිවෙල යටතේ ලියාපදිංචි විදේශිය හා දේශිය රැකියා ආයතන මගින් පුහුණුලාභීන් 4,328 දෙනෙකු රැකියාගත කරන ලදි.මෙයින් 3,733 දෙනෙකු දේශීය රැකියා සඳහා ද 60 දෙනෙකු විදේශීය රැකියා සඳහා ද 535 දෙනෙකු ස්වයං රැකියා සඳහා ද යොමු කරනු ලැබිණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය හා විදේශීය රැකියා ආයතන 62ක් ලියාපදිංචි කරන ලදි. මෙසේ ඵලදායී ලෙස රැකියා ගත කිරීම තුලින් ජාතික ආර්ථිකයට රුපියල් මිලියන 681 කින් පමණ දායකත්වයක් ලබා දීමට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට හැකිවිය.

### රැකියාගත කිරීම පිළිබඳ තොරතුරු

| | දිස්ත්‍රික්කය/ජාතික වෘත්තීය පුහුණු ආයතනය | දේශීය | විදේශීය | ස්වයං | එකතුව |
|---|---|---|---|---|---|
| 1. | ප්‍රධාන කාර්යාලය | 58 | 0 | 0 | **58** |
| 2. | ජා.වෘ.පු.ආ - නාරාහේන්පිට | 144 | 3 | 10 | **157** |
| 3. | ජා.වෘ.පු.ආ - ඔරුගොඩවත්ත | 10 | 0 | 0 | **10** |
| 4. | ජා.වෘ.පු.ආ - රත්මලාන | 70 | 0 | 0 | **70** |
| 5. | ජා.වෘ.පු.ආ - නියාගම | 148 | 10 | 09 | **167** |
| 6. | ජා.වෘ.පු.ආ - බද්දේගම | 55 | 2 | 9 | **66** |
| 7. | ජා.වෘ.පු.ආ - මිරිජ්ජවිල | 31 | 0 | 0 | **31** |
| 8. | කොළඹ | 404 | 6 | 35 | **445** |
| 9. | ගම්පහ | 121 | 0 | 57 | **178** |
| 10. | කළුතර | 201 | 1 | 35 | **237** |
| 11. | ගාල්ල | 315 | 0 | 42 | **357** |
| 12. | මාතර | 225 | 0 | 21 | **246** |
| 13. | හම්බන්තොට | 290 | 0 | 88 | **378** |
| 14. | බදුල්ල | 177 | 0 | 8 | **185** |
| 15. | මොණරාගල | 102 | 1 | 16 | **119** |
| 16. | රත්නපුර | 128 | 0 | 10 | **138** |
| 17. | කෑගල්ල | 267 | 16 | 6 | **289** |
| 18. | මහනුවර | 222 | 8 | 58 | **288** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 19. | මාතලේ | 10 | 0 | 0 | **10** |
| 20. | නුවරඑළිය | 103 | 0 | 0 | **103** |
| 21. | පොළොන්නරුව | 133 | 0 | 13 | **146** |
| 22. | අනුරාධපුර | 139 | 4 | 5 | **148** |
| 23. | කුරුණෑගල | 87 | 4 | 67 | **158** |
| 24. | පුත්තලම | 182 | 0 | 9 | **191** |
| 25. | අම්පාර | 36 | 1 | 37 | **74** |
| 26. | ත්‍රිකුණාමලය | 75 | 5 | 0 | **80** |
| | **එකතුව** | **3,733** | **60** | **535** | **4,328** |



## රැකියා ස්ථාපනය තුලින් ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය

| වර්ගය | රැකියා ස්ථාපනය | ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය (රුපියල් මිලියන) |
|---|---|---|
| දේශීය | 3733 | 542.26 |
| විදේශීය | 60 | 31.47 |
| ස්වයං | 535 | 107.38 |
| **එකතුව** | **4328** | **681.11** |

- 2012 වර්ෂයේ රැකියා ගත කරන ලද පුහුණු ලාභීන් සංඛ්‍යාව වසරකට ලබන ආදායම දළ වශයෙන් ඇස්තමේන්තු කර සකස් කර ඇත.

### රැකියා ස්ථාපනය කල සංඛ්‍යාව

| වර්ෂය | දේශීය | විදේශීය | ස්වයං | එකතුව |
|---|---|---|---|---|
| 2010 | 4,370 | 130 | 826 | **5,326** |
| 2011 | 5,927 | 98 | 593 | **6,618** |
| 2012 | 3,733 | 60 | 535 | **4,328** |

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් රැකියාගත කල තොරතුරු පමණි.



## 09. රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධතා ගොඩනැගීම මගින් ශිල්පීය දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම.

වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට තමාගේ දැනුම හා කුසලතාවය වර්ධනය කර ගැනීමටත්, වෙනස් වන ලෝකයේ නව තාක්‍ෂණික දැනුම ලබා දීමත් අරමුණු කරගෙන මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව 2012 වසරේදී රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන 06 ක සහය ඇතිව මෙවැනි වැඩසටහන් 30 ක්, ක්ෂේත්‍ර 06 ක් සඳහා පැවැත්වීමට හැකි වූ අතර, 3,083 දෙනෙකුට තම හැකියාවන් වැඩි දියුණු කර ගැනීමට අවස්ථාව සැලසිනි.

### කුසලතා සංවර්ධන වැඩසටහන් හි ප්‍රගතිය

| | වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව | අනුග්‍රාහක ආයතන |
|---|---|---|---|---|
| 1 | ටයිල් ඇතිරීම | 10 | 360 | • ලංකා ටයිල්ස් සමාගම |
| 2 | රූපලාවන්‍ය | 16 | 2336 | • නේචර්ස් බියුටි ක්‍රියේෂන් පුද්ගලික සමාගම<br>• ඔරිෆ්ලේම් පුද්ගලික සමාගම |
| 3 | බේකරි | 01 | 80 | • ඒ.බී.මයුරි සමාගම |
| 4 | වඩු කාර්මික | 01 | 45 | • මැක්බර්ටෙන් ලිමිටඩ් |
| 5 | ජල නල කාර්මික | 01 | 68 | • ෆීනික්ස් ෆෝලෝ ගාර්ඩ් |
| 6 | විදුලි කාර්මික | 02 | 194 | • ACL කේබල් පුද්ගලික සමාගම |
| එකතුව | | **31** | **3,083** | |

## 10. <u>අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.</u>

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ අරමුණු ලගා කර ගැනීම සඳහා ගත් විවිධ ක්‍රියාමාර්ග අතර වෘත්තීය පුහුණු අවස්ථා වැඩි දියුණු කිරීම හා ගුණාත්මක භාවය වැඩිකිරිම අරමුණු කරගනිමින් 2012 වසර තුළ දී විවිධ රාජ්‍ය හා පෞද්ගලික අධ්‍යාපන ආයතන සමග අවබෝධතා ගිවිසුම් 5 කට අත්සන් කරනු ලැබීය.

එම අවබෝධතා ගිවිසුම් පහත පරිදි වේ.

| | අවබෝධතා ගිවිසුම | ආයතනය |
|---|---|---|
| 1 | වව්නියා දිස්ත්‍රික්කයේ මුන්රිමුරිප්පු, මදවුවයිතකුලම් වන්-සු-ලාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීම. | විහාරාධිපති අලව්ව කුඩුමුල්ල ශ්‍රී ධර්මපාලාරාම සහ කපුවරල ශ්‍රී මලියදේව අරහන්ත රජමහා විහාරස්ථානය. |
| **2** | වෘත්තීය පුහුණු පාඨමාලා හඳාරණ,හැදෑරූ සහ වෘත්තීය ක්ෂේත්‍රවල නියැලී ඇති ශිල්පීන් සඳහා රූපලාවන්‍ය වැඩසටහන් පැවැත්වීම. | නේචර්ස් බියුටි ක්‍රියේෂන් පුද්ගලික සමාගම |
| 3 | ශ්‍රී ලාංකික තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව සහ අදාළ පුහුණු උපකරණ ලබා දී මැලේසියාවේ රැකියා සඳහා යොමු කිරීම. | මැලේසියානු (ශ්‍රී ලංකා) සංවිධානය |
| 4 | බද්දේගම ගොතටුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යාම. | පිකස්පෝන් පදනම |
| 5 | දෙල්ගොඩ, අහුගම්මන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යාම. | සිරිජයන්ති මහාකරුණා තරුණ මධ්‍යස්ථානය |

## 11. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ නියැළෙන්නන් හට කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරයන් ආරම්භ කිරීමට මග පෙන්වීමක් වශයෙන් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ. 2012 වර්ෂයේ දී දිවයින පුරා පැවති මෙවැනි වැඩසටහන් 27 ක් මගින් 548 දෙනෙකු සඳහා සේවය ලබා දීමට හැකිවිය. තවද තෝරාගත් පාඨමාලා සඳහා පුහුණුව ලබමින් සිටින කාලය තුල "ඔබේ ව්‍යාපාරය ගැන දැන ගන්න" (Know About Business) වැඩසටහන් 16 ක් මගින් 160 දෙනෙක් සඳහා ව්‍යාපාරික දැනුම හා කුසලතාවය ලබා දීමට හැකිවිය.

මෙවැනි වැඩසටහන් තුළින් ලබාගත් දැනුම උපයෝගී කරගනිමින් ව්‍යාපාර සැලසුම් සකස් කර 2012 වසර තුල දී වෘත්තීය පුහුණුව ලත් ආධුනිකයන් 78 දෙනෙකුට රුපියල් මිලියන17 කට ආසන්න මුදලක් ණය වශයෙන් මහජන බැංකුව, ලංකා බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු වැනි රාජ්‍ය බැංකු වලින් ලබා ගැනීමට කටයුතු සම්පාදනය කර දීමට හැකි වීම මගින් ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියට තරුණ ව්‍යාවසායකයන් සවිබල ගැන්වීමට හැකි විය.

## 12. අභියෝග

- නවීන තාක්‍ෂණය උපයෝගී කර ගනිමින් පුහුණු කටයුතු කිරීම සඳහා හැකියාව ඇති උපදේශක වරුන්ගේ හිඟකම හා ඔවුන්ට ඉහළ මට්ටමේ වැටුපක් ගෙවීමට ඇති අපහසුතාවය.

- පුහුණු කිරීමේ ක්ෂේත්‍ර හා රැකියා අවස්ථා අතර ඇති නොගැලපීම අවම කර ගැනීම.

- සේවා සපයන ආයතනයක් ලෙස රජය විසින් වෙන් කරන ප්‍රාග්ධන හා පුනරාවර්ථන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

- දිවයින පුරා ක්‍රියාත්මක සෑම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකටම සමාන මට්ටමේ පහසුකම් සැපයීමට අපොහොසත් වීම.

- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැතිවීම.

- වෘත්තීය පුහුණුවේ වැදගත්කම පිළිබඳව සමාජය දැනුවත් කිරීමට පුළුල් ප්‍රචාරාත්මක වැඩසටහන් දියත් කිරීමට සිදු වීම.

- වෘත්තීය පුහුණුව සපයන පෞද්ගලික අංශයේ ආයතන හා තරගකාරීව කටයුතු කිරීමට සිදුවීම.

- වෘත්තීය පුහුණුව සපයන රාජ්‍ය නොවන සංවිධාන හා අනෙකුත් ආයතන හරහා සපයන පහසුකම් වැඩිවීම නිසා ඒ අයුරින්ම පහසුකම් සැපයීමට අපහසු වීම.

- තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව කෙරෙහි ආකර්ෂණය කර ගැනීමට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවීම.

- ශ්‍රම ඉල්ලුමක් ඇති ශිල්පීය මට්ටමේ පාඨමාලාවන්ට තරුණ තරුණියන්ගේ වැඩි නැඹුරුතාවයක් නොමැති වීම.

## *2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනය*

සමාලෝචිත වර්ෂය තුළදී මහ භාණ්ඩාගාරය, අමාත්‍යාංශය, දේශීය හා විදේශීය ආධාරකරුවන් විසින් අධිකාරිය වෙත රු.1,363,838,143.33ක සම්පූර්ණ මුදලක් ලබා දෙන අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **1.1රජයේ ප්‍රදාන** | **වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (.රු)** | **නිදහස් කරන ලද මුදල (.රු)** |
|---|---|---|
| මහා භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්ත | 850,000,000.00 | 850,000,000.00 |
| මහා භාණ්ඩාගාර ප්‍රදාන -ප්‍රාග්ධන | 591,500,000.00 | 475,900,000.00 |
| අමාත්‍යාංශය - ප්‍රදාන පුනරාවර්ථන | 25,074,000.00 | 25,074,000.00 |
| යුනිසෙෆ් | 3,854,143.33 | 3,854,143.33 |
| එච්.අයි .ටී .එම් . | 7,600,000.00 | 7,600,000.00 |
| ප්‍රාදේශීය ධීවර ජීවනෝපාය වැඩසටහන | 1,410,000.00 | 1,410,000.00 |
| **මුළු මුදල** | **1,479,438,143.33** | **1,363,838,143.33** |
| **ආදායම 1.2** | **අයවැයගත (.රු)** | **උපයන ලද ශුද්ධ ආදායම (.රු)** |
| ආදායම | **80,000,000.00** | **125,951,193.21** |

වන දිනෙන් 31 දෙසැම්බර් මස 2012අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

පහත සඳහන් ලේඛන ඇතුළත් කර ඇත :

01. 2012 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
02. 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය
03. 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
04. 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය
05. මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

---------------------------------------- ----------------------------------------

කර්නල් එස්රත්නායක ආර්ඩබ්පී.පී.ආර් .,ආර්එස්පී

සභාපති

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ප්‍රසාද් ලොකුගලප්පත්ති

අධ්‍යක්ෂ (මුදල්)

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**

**2012 වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මුල්‍ය ප්‍රකාශනය පිළිබඳ අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපතිවරයාගේ ප්‍රකාශනය**

දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මුල්‍ය පුකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව 1995 අංක 38 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත සහ 1991 අංක 38 දරණ මුදල් පනත මඟින් නියම කර ඇති ආකාරයට හා ක්‍රමවේදය අනුව පිළියෙල කර ඇත.

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය මගින් නියම කර ඇති නීතිරීති හා ක්‍රියා පටිපාටීන්ට අනුගතව කටයුතු කර ඇති අතර වත්කම් ආරක්‍ෂා කිරීම සහ ගනුදෙනු වල ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාවය සහතික කිරීම සඳහා හැකිතාක් දුරට ප්‍රායෝගික ලෙස පාලන පද්ධතින් පවත්වා ගෙන ඇත.

2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මුල්‍ය පුකාශන මා දන්නා පමණින් සාර්ථක ලෙස පිළියෙල කර ඇති අතර ,එමඟින් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මුල්‍ය තත්ත්වය පිළිබඳ සැබෑ සහ සාධාරණ චිත්‍රයක් පිළිබිඹු කෙරේ.

සභාපති

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

## 2012 දෙසැම්බර් මස 31 වන දින වන විට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | **2012 (රු.)** | | **2011 (රු.)** | |
|---|---|---|---|---|---|
| වත්කම් | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| **දේපල පිරියත හා උපකරණ** | 2 | **5,602,397,206.13** | | 4,955,516,007.34 | |
| **කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු** | 3 | **42,515,103.96** | | 70,945,141.57 | |
| **අනෙකුත් මූල්‍ය වත්කම්** | | | | | |
| **ස්ථාවර තැන්පතු** | | **25,000.00** | **5,644□937,310.09** | 25,000.00 | 5,026,486,148.91 |
| **ජංගම තැන්පතු** | | | | | |
| **භාණ්ඩ ලේඛන** | 4 | **27,743,984.66** | | 22,466,182.82 | |
| **ලැබිය යුතු** | 5 | **27,004,876.03** | | 32,431,994.51 | |
| **කාර්යමණ්ඩල ණය** | 6 | **39,915,619.33** | | 38,871,607.32 | |
| **මුදල් හා මුදල් තුල්‍යයන්** | 7 | **85,636,160.92** | **180,300,640.94** | 89,181,574.70 | 182,951,359.35 |
| **මුළු වත්කම්** | | | **5,825,237,951.03** | | **5,209,437,508.26** |
| **කොටස් හා වගකීම්** | | | | | |
| **සමුච්චිත අතිරික්තය (ඌන)** | | **-517,566,571.16** | | (517,459,890.9□) | |
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ විගණන මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ වාහන සඳහා දරන ලද අලුත්වැඩියා වියදම් රු.1,447,739 ක් වාහන මිලදී ගැනීම් වශයෙන් ගිණුම් ගත කර තිබුණි. මේ හේතුව නිසා වර්ෂයේ ක්ෂයවීම් රු.361,935 කින් හා ස්ථාවර වත්කම් රු.1,447,739 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් පාරිතෝෂික වෙන්කිරීම් රු.916,697 ක් අඩුවෙන් දක්වා තිබූ අතර පාරිතෝෂික ගෙවා අවසන් කරන ලද සේවකයකු සඳහා වෙන් කරන ලද රු.112,227ක් ගිණුම්වල ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අයකල යුතුව තිබූ රු.171,206 ක්වූ වැටුප් රහිත නිවාඩු හා අධිකාරියේ නිලධාරීන්ගෙන් දුරකථන ගාස්තු වශයෙන් අයවිය යුතු රු.151,437 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) අධිකාරියේ පුස්තකාල පොත්වල වටිනාකම ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ගෙවීම් කටයුතු මෙන්ම ඉදිකිරීම් කටයුතුද අවසන් කර තිබූ රු.8,802,937 ක්වූ ඉදිකිරීම් කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබූ නිසා ස්ථාවර වත්කම් හා ක්ෂයවීම්ද අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ගෙවිය යුතු විගණන ගාස්තු රු.350,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ බොල්ණය ලෙස රු.11,122,147 ක් කපාහැර තිබුණු අතර ඉන් රු.1,102,185 ක්වූ ශේෂ අධිකාරිය යටතේ පාලනය වන ආයතනවලින් ද රු.10,020,262 ක් බාහිර ආයතනවලින් ද ලැබිය යුතු ව තිබුණි.

(ආ) එකතුව රු. 4,727,992 ක් වූ ණයගැති ශේෂ 37 ක් වර්ෂ 06 ක කාලයක්ද එකතුව රු.6,665,228 ක් වූ ශේෂ 18 ක් වර්ෂ 10 ක කාලයක් ද ඉක්මවා තිබූ නමුත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 9 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ රු.129,773 ක අත්තිකාරම් ශේෂයක් නිරවුල් කර නොතිබුණි.

(ඈ) ශිෂ්‍යත්ව ලබා විදේශගතවූ නිලධාරීන් තුන්දෙනෙකු නැවත සේවයට වාර්තා කර නොතිබූ අතර ඒ සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියෙන් වැය කරන ලද රු.7,582,956 ක් හා අධිකාරිය විසින් වැටුප් සහ දීමනා ලෙස ගෙවන ලද රු. 581,748 ක මුදල අයකර ගෙන නොතිබූ අතර මේ සම්බන්ධව බැඳුම්කර ලබාගෙන නොතිබුණි.

(ඉ) පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා 2012 දෙසැම්බර් මාසයේදී රු. 9,076,745 ක අත්තිකාරම් ගෙවා තිබූ නමුත් එම භාණ්ඩ 2013 ජුනි මාසය දක්වාත් ලැබී නොතිබුණි.

(ඊ) 2008 සිට 2010 දක්වා වූ වර්ෂවලට අදාල රු.6,375,042 ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කර නොතිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

| විෂයය | වටිනාකම රු. | නොසැපයූ ලිඛිත සාක්ෂි |
|---|---|---|
| ඉඩම් | 1,703,131,187 | හිමිකම් ඔප්පු හා අයිතිය තහවුරු කිරීමේ ලේඛන |
| තොගය | 27,743,985 | විස්තරාත්මක උපලේඛන/ ලැබීම් හා නිකුත් කිරීම් සටහන් ඇතුළත් බින්කාඩ් |
| ලැබිය යුතු ශේෂ | 27,004,876 | විස්තරාත්මක උපලේඛණ හා සනාථ කිරීම් |
| ප්‍රවර්ධන වියදම් | 340,272 | ගෙවීම් වලට අදාල සමරු කලාප, පුවත්පත් දැන්වීම් හා විස්තර සහිත ලිපිගොනුව |
| වියදම් (Selesene) | 6,500,000 | තොරතුරු ඇතුළත් ලිපිගොනුව |
| ලෝක සංචාරක දින වියදම් | 1,000,000 | වියදම් පිළිබඳවවිස්තර ඇතුළත් ලිපිගොනු |
| ඉන්ධන | 13,826,300 | වාහන 141කට අදාල ධාවන සටහන් හා වාහන 17 කට අදාල මාසික සාරාංශ |

| | | |
|---|---|---|
| දැයට කිරුළ වියදම් | 3,649,031 | භාණ්ඩ භාරදුන් බවට තොරතුරු හා ගෙවීම් සනාථ කිරීමට අදාල ලියවිලි |
| දැයට කිරුළ ගමන් වියදම් අත්තිකාරම් | 400,000 | අත්තිකාරම් වවුචර් හා ගෙවීම් නිරවුල් කිරීම් වවුචර් |

2.2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත 13 (5) (ඩී) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ පළමු සහ දෙවන අර්ධ වර්ෂය සදහා වූ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ආයතන සංග්‍රහය | |
| (i) VIII පරිච්ඡේදයේ 6.1 වගන්තිය | පැයකට ගෙවිය යුතු අතිකාල දීමනාව දිනක වැටුපෙන් 1/8 ක් හා දිනක වැටුප, මාසික වැටුපෙන් 1/30 ක් ලෙස ගණන් බැලිය යුතු වුවත් අධිකාරිය විසින් දිනක වැටුප 1/20 ක් ලෙස ගණන් බලා අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (ii) IX පරිච්ඡේදයේ 2.2 වගන්තිය | කාර්යාල වේලාවෙන් පසුව කරන ලද රාජකාරි වෙනුවෙන් ලබන දීමනා වලින් සියයට 10 ක් අයකර ආදායමට ගත යුතු වුවත් අර්ධකාලීන පාඨමාලාවල දේශන ගාස්තු හා අනෙකුත් දීමනා ගෙවීමේදී එලෙස අයකර නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි | |
| (i) අංක 104 | වාහන අනතුරු 13 ක් සම්බන්ධ අලාභහානි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) අංක 188 (2) | තැන්පත් කල රු. 387,883 ක් වූ තැන්පතු බැංකුවට බැර වී නොතිබුණද ඒ සම්බන්ධයෙන් විමර්ශනය කර නොතිබුණි. |

(ඈ) භාණ්ඩාගාර චක්‍රලේඛ

(i) 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58/02 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.1 වගන්තිය

සභාපතිවරයාට සහ උපසභාපතිවරයාට ලබාදෙන දීමනාවලින් හා රැස්වීම්වලට සහභාගිවීම වෙනුවෙන් ලැබෙන දීමනාවෙන් සියයට 10 ක් වශයෙන් රඳවා ගැනීම් බදු අය කලයුතු වුවත්, අවස්ථා 20 කදී අයකර ගත යුතුව තිබූ රු.81,417 ක් අය කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) වගන්තිය

වාහන අලුත්වැඩියා වටිනාකම රු.200,000 කට වැඩිවන විට අමාත්‍යංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එම විධිවිධානවලට පටහැනිව අවස්ථා 7 කදී රු.3,082,265 ක් ගෙවා තිබුණි.

(iii) 1971 ජූලි 26 දිනැති අංක 810 දරන චක්‍රලේඛය

වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයකර ගැනීම එම මාසයේ හෝ ඊට පසුව එලඹෙන මාසයේ අය කල යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි.

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

(i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය

සෑම මාස 06 කට වරක්ම වාහනවල ඉන්ධන දැවීම පිළිබඳව පරික්ෂා කළ යුතු වුවත් එලෙස සිදු කර නොතිබුණි.

(ii) 2008 ජූනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 3 වන වගන්තිය

නිලවාහනවලට අනුයුක්ත රියදුරන් අතිකාල දීමනා ඉල්ලුම් කිරීමේදී චක්‍රලේඛයේ ඇමුණුම් අංක 01 ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) 2003 ජූනි 2 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 6.5.1 වගන්තිය

වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් සකස් කර මූල්‍ය ප්‍රකාශන සමග විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 6.6 වගන්තිය — 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(iii) 9.3.1 වගන්තිය — වැඩබැලීමේ පත්වීම් නොකළ යුතු අතර එසේ සිදු කලද එය දිර්ඝකාලීනව සිදුනොකල යුතු වුවත් ඊට පටහැනිව මාස 06 සිට වර්ෂයක කාලයකට වඩා වැඩබැලීමේ පත්වීම් කළ අවස්ථා 18 ක් විය.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතුවලින් රු.16,030,860 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 18,333,666 ක් විය. ඉකුත් වර්ෂය සමග සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලවල රු.34,364,526 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මූල්‍ය ප්‍රතිඵලවල වර්ධනය සඳහා පසුගිය වර්ෂයට වඩා රජයේ ප්‍රදාන වැඩිවීම, විවිධ ආදායම් වැඩිවීම, විලම්බිත ආදායම වැඩිවීම හා වෙනත් මෙහෙයුම් වියදම්වල අඩුවීම බලපා තිබුණි.

3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික කටයුතු

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සේවකයන් විසින් ආයතනයට එරෙහිව නඩු 10 ක් ද, බාහිර ආයතන විසින් නඩු 2 ක් දපවරා තිබුණි.

3.3 වියදම්වල වැඩිවීම

සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම්වල හා ජංගම වත්කම්වල වෙනස්වීම් හා ද්‍රවශීලතා අනුපාතයන් පහත දැක්වේ.

| | | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. මි | රු. මි |
| ශුද්ධ වත්කම් | | (485.64) | (481.05) |
| ශුද්ධජංගම වත්කම් | | 102.82 | 79.42 |
| | සම්මත | තථ්‍ය | තථ්‍ය |
| ජංගම අනුපාතය | 2:1 | 1:2.33 | 1.77 |
| ක්ෂණික අනුපාතය | 1:1 | 1:1.97 | 1.55 |

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුහුණු කටයුතු

ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව, 2012 වර්ෂයේදී ක්ෂේත්‍ර 27 ක් තුළ පාඨමාලා 98 ක් සඳහා ආධුනිකයින් 28,335 ක් බඳවා ගැනීමට අපේක්ෂා කර තිබූ අතර ආධුනිකයින් 29,064 ක් බඳවාගෙන තිබුණි. ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවලට 2,775 දෙනෙකු බඳවාගෙන තිබූ අතර එයින් 230 දෙනෙකු පාඨමාලා හැර ගොස් තිබුණි. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවලට 26,289 දෙනෙකු බඳවාගෙන තිබූ අතර එයින් 3,035 දෙනෙකු පාඨමාලා හැර ගොස් තිබුණි. 2011 වර්ෂයේදී ක්ෂේත්‍ර 15 ක් තුළ පාඨමාලා 101 ක් සඳහා ආධුනිකයින් 29,251 කට පුහුණුව ලබා දී තිබුණි.

(ආ) ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ පාඨමාලා සඳහා ආධුනිකයින් බඳවා ගැනීම සහ සහතික පත්‍ර ලබාදීම පිළිබඳ ඇස්තමේන්තුගත තත්ත්වය හා තථ්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| කාර්යය | ආධුනික සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | වැඩිවීම / (අඩුවීම) | වැඩිවීම/(අඩුවීම) ප්‍රතිශතයක් ලෙස |
| i. බඳවා ගැනීම | 28,335 | 29,064 | 729 | 2.57 |
| ii. සහතික පත්‍ර ලබා දීම NVQ | 11,200 | 7,999 | (3,201) | (28.58) |
| iii. සහතික පත්‍ර ලබා දීම Non NVQ | 6,400 | 6,601 | 201 | 3.14 |

(ඇ) ආධුනිකයින් පාඨමාලා හැර යාම

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 05 තුළ ආධුනිකයින් බඳවා ගැනීම සහ පාඨමාලා හැරයාම පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි විය.

| වර්ෂය | බඳවාගත් සංඛ්‍යාව | පාඨමාලා හැරගිය සංඛ්‍යාව | පාඨමාලා හැරගිය සංඛ්‍යාව බඳවාගත් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|
| 2007 | 24,302 | 3,884 | 15.98 |
| 2008 | 25,362 | 4,507 | 17.77 |
| 2009 | 27,752 | 5,721 | 20.60 |
| 2010 තොරතුරු ඉදිරිපත් නොකරන ලදි. | | | |
| 2011 | 29,251 | 3,635 | 12.43 |
| 2012 | 29,064 | 3,265 | 11.23 |

වාර්ෂිකව පාඨමාලා හැර යන සංඛ්‍යාව සැලකිය යුතු අගයක් ගෙන තිබුණු අතර, එම සංඛ්‍යාව අවම කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදීද ක්‍රියාමාර්ග ගත් බවට තොරතුරු නොවුණි. තවද 2012 මුල් අර්ධ වර්ෂයේ පාඨමාලාවලට බඳවාගන්නා ලද ආධුනිකයින් අතරින් 1,493 දෙනෙකු පාඨමාලා හැරයාම් ලෙස සලකා කටයුතු කර තිබු අතර ඔවුන්ගෙන් අයවිය යුතු රු.5,320,000 ක පාඨමාලා ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස කපා හැර තිබුණි. පාඨමාලා සංඛ්‍යාව අනුව පාඨමාලා හැරයාම සියයට 100 ක්වූ අවස්ථා 3 ක්ද , සියයට 50 ඉක්මවූ අවස්ථා 29 ක් හා සියයට 50 සිට සියයට 20 දක්වා වූ අවස්ථා 149 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පුහුණුව නිමකරන ආධුනිකයින් 5,500 ක් රැකියා සඳහා යොමු කිරීමට අපේක්ෂා කළද, රැකියා සඳහා යොමු කිරීමට හැකිවී තිබුණේ 4,328 දෙනෙකු පමණි. එය අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා 1,172 කින් හෙවත් සියයට 21.30 කින් අඩු අගයක් විය. වාර්ෂිකව පාඨමාලා නිම කරන ලද ආධුනිකයන් 2011 වර්ෂයේ 6,618 දෙනෙකු රැකියාගත කර තිබුණු අතර 2012 වර්ෂයේ රැකියාගත කර තිබුණේ 4,328 ක් පමණි. ඒ අනුව 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ සියයට 35 කින් රැකියාගත කිරීම් අඩුවී තිබුණි.

(ඉ) පර්යේෂණ හා සංවර්ධන අංශය සඳහා සමාලෝචිත වර්ෂයේ රු 500,000 ක් වෙන්කර පර්යේෂණ 03 ක් හා සෙවුම් අධ්‍යයන (Tracer Study) 05 ක් වශයෙන් පර්යේෂණ 08 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද පර්යේෂණ කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව අධිකාරිය විසින් අදාළ අංශය ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබූ බවත් මෙම අංශයට අනුයුක්ත සේවකයන් නිෂ්කාර්යව සිටි බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) පෙර ඉගෙනුම් හැදිනීම් (RPL) පැවැත්වීමට ඉලක්ක කර නොතිබූ අතර ක්ෂේත්‍ර 12 ක් යටතේ පවත්වා තිබූ වැඩසටහන්වලට 383 දෙනෙකු සහභාගි වී තිබූ අතර පුහුණු ක්ෂේත්‍රවල නියලෙන්නන්ට තම දැනුම හා කුසලතාවය වර්ධනය කර ගැනිමේ වැඩසටහන් 40 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණද පවත්වා තිබුණේ වැඩසටහන් 31 ක් පමණි.

(උ) වෘත්තිය මාර්ගෝපදේශනය හා උපදේශන වැඩසටහන්

වෘත්තිය මාර්ගෝපදේශනය හා උපදේශන ඒකකය මගින් වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන් 2,441 ක් සමාලෝචිත වර්ෂය තුල පවත්වා තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. පවත්වන ලද වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සංඛ්‍යාව සහ සහභාගීවූ සංඛ්‍යාව 2011 වර්ෂයට සාපේක්ෂව වැඩි වී තිබුණි. 2011 වර්ෂයේදී දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 319 ක් පවත්වා ඒ සඳහා 15,997 දෙනෙකු සහභාගී වී තිබූ නමුත් 2012 වර්ෂයේදී එවැනි වැඩසටහන් කිසිවක් පවත්වා නොතිබුණි.

ii නිපුණතා බලකාය සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 22 ක් පවත්වා තිබූ අතර එය අපේක්ෂිත මට්ටමට වඩා සියයට 50 කින් අඩුවී තිබුණි.එහි සහභාගීත්වය අපේක්ෂිත මට්ටමට වඩා 2,474 කින් හෙවත් සියයට 56 කින් පමණ අඩුවී තිබුණි.

iii යොවුන් සේනාංක දැනුවත් කිරීමේ වැඩසටහන් 76 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණද පවත්වා තිබුණේ 50 ක්වූ හෙයින් එය අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 34 ක අඩුවීමක් විය. යොවුන් සේනාංකවලින් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සඳහා සහභාගීවී තිබුණේ 3,492 දෙනෙකු වූ අතර එය ඉලක්කගත සංඛ්‍යාවට වඩා සියයට 54.05 කින් අඩුවීමක් විය.

iv. පුහුණුවන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන් 552 ක් පැවැත්වීමට ඉලක්කකර තිබුණද පවත්වා තිබුණේ 415 ක්වූ හෙයින් එය අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 24 ක අඩුවීමක් විය. මෙම වැඩසටහන් සඳහා 24,840 දෙනෙකුගේ සහභාගිත්වය අපේක්ෂා කලද සහභාගිවී තිබුණේ 14,878 දෙනෙකු පමණි.

v. පෙර පුහුණු වැඩසටහන් 390ක් පැවැත්වීමට අපේක්ෂා කලද පවත්වා තිබුණේ වැඩසටහන් 328 ක්වූ හෙයින් එය අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 15.89 ක අඩුවීමක් විය. මෙම වැඩසටහන් සඳහා 23,400 දෙනෙකුගේ සහභාගිත්වය අපේක්ෂා කලද ඒ

සඳහා සහභාගීවී තිබුණේ 15,081 දෙනෙකු වු හෙයින් එය අපේක්ෂිත ප්‍රමාණයට වඩා සියයට 35.55 කඅඩුවීමක් විය.

(ඍ) සමාලෝචිත වර්ෂය තුල ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 30 ක් පැවැත්වීමටත් ඒ සඳහා 750 දෙනෙකුගේ සහභාගීත්වයක් අපේක්ෂා කර තිබුණද, පවත්වා තිබුණේ වැඩසටහන් 27 ක් වු අතර ඒ සඳහා සහභාගී වී තිබුණේ 548 දෙනෙකු පමණි.

(එ) "ඔබේ ව්‍යාපාරය ගැන දැන ගන්න" යන තේමාව යටතේ වැඩසටහන් 20 ක් මගින් 500 දෙනෙකු දැනුවත් කිරීමට අපේක්ෂා කලද වැඩසටහන් 16 ක් මගින් දැනුවත් කර තිබුණේ 160 දෙනෙකු පමණි. ඉලක්කගත තත්ත්වය අනුව එක් වැඩසටහනකින් 25 දෙනෙකු දැනුවත් කිරීමට ඉලක්ක කර තිබුණද එක් වැඩසටහනකින් දැනුවත් වීම සිදුවී තිබුණේ 10 දෙනෙකු පමණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දී වෘත්තිය පුහුණුවලත් ආධුනිකයින් 150 දෙනෙකුට රුපියල් මිලියන 37.5 ක ණය ලබාදීමට අපේක්ෂා කලද ආධුනිකයින් 78 දෙනෙකුට රුපියල් මිලියන 17 ක ණය පමණක් ලබාදී තිබුණි.මෙය අපේක්ෂා කල ප්‍රමාණයට වඩා සියයට 55 ක අඩුවීමක් විය.

(ඔ) සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද අර්ධ කාලීන පාඨමාලා 168 කින් පාඨමාලා135 ක අවම ආධුනිකයින් සංඛ්‍යාවක් නොවීම, එකම පාඨමාලාවට විවිධ ගාස්තු අයකිරීම, පාඨමාලා ගාස්තු එකවර අය නොකිරීම හා රු.5,874,000 ක්වු හිඟ පාඨමාලා ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබු බවත් නිරීක්ෂණය විය.

(ඕ) 2011 වර්ෂයේ මධ්‍යස්ථාන 26 ක පාඨමාලා 231 කට සහ 2012 වර්ෂයේ මධ්‍යස්ථාන 23 ක පාඨමාලා 152 කට අදාල සහතිකපත්‍ර 2013 අගෝස්තු මාසය දක්වාත් නිකුත් කර නොතිබුණි.

(ක) පාඨමාලා ප්‍රතිතනය කිරීම සඳහා ඉකුත් වර්ෂවල තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභා ආධාර වශයෙන් ලබාදී තිබු රු.10,229,081 ක් ගෙවිය යුතු මුදල් ලෙස දක්වා තිබුණු අතර පුහුණු උපකරණ මිලදී ගැනීම 2013 අගෝස්තු දක්වාම සිදු කර නොතිබුණි. ලබාදුන් ආධාර මුදල්වලින් මාසයක් ඇතුළත උපකරණ මිලදීගෙන අදාල ලියවිලි කොමිෂන් සභාවට යැවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.2 කළමණාකරන අකාර්යක්ෂමතා

(අ) පුහුණු පාඨමාලා පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) 2004 ජනවාරි 28 දිනැති අංක ටීවීඊටී/1/ව.ලේ/2004/1 දරන තෘතියික අධ්‍යාපන හා පුහුණු අමාත්‍යංශයේ ලේකම්වරයාගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මුළු ධාරිතාවෙන් සියයට 70 ක් පාඨමාලා ආරම්භ කරන විට සිටිය යුතු අතර එලෙස නොවන විට අමාත්‍යංශ ලේකම්වරයාගේ අවසර ලබාගත යුතුය. සමාලෝචිත වර්ෂයේ පාඨමාලා 312 ක් සියයට 70 ධාරිතාවය නොමැතිව ආරම්භ කර තිබූ අතර පාඨමාලා 92 ක ධාරිතාවය සියයට 50 කට වඩා අඩු ප්‍රමාණයක් විය.

(ii) පාඨමාලා ආරම්භ කිරීමේදී අවම ධාරිතාවය නොමැති වීම, චක්‍රලේඛය ප්‍රකාරව ධාරිතාවය අවම වූ විට විකල්ප ක්‍රියාමාර්ග නොගැනීම, චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳ අවධානය යොමු නොකිරීම යනාදී හේතු නිසා පාඨමාලා අවසානයේදි ආධුනිකයන් සංඛ්‍යාව අඩුවී තිබුණි. චක්‍රලේඛයේ සඳහන් ක්‍රමවේදය අනුගමනය නොකිරීම නිසා පාඨමාලා හැරයන ආධුනිකයින්ගේ සංඛ්‍යාව සියයට 30 ඉක්ම වූ පාඨමාලා 182 ක් වූ අතර ඉකුත් වර්ෂයේදි එය 87 ක් විය.

(ආ) විශේෂඥ උපදේශකවරුන් බඳවා ගැනීම

පරිගණක හා හෝටල් යන ක්ෂේත්‍ර සඳහා මාසිකව රු.150,000 ක්වූ දීමනාවක් ගෙවීමේ පදනම මත උපදේශකවරුන් දෙදෙනෙක් බඳවාගෙන තිබුණි. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලැබී තිබුණු අතර උපදේශකවරුන් බඳවා ගැනීම තුලින් අධිකාරිය අපේක්ෂා කල පාඨමාලාවල ගුණාත්මකභාවය, ආධුනිකයන් සංඛ්‍යාව වැඩිකර ගැනීම, ආදායම් තත්ත්වය ඉහල මට්ටමකට ගෙන ඒම ඇතුළු අනෙකුත් පවරන ලද වගකීම් ඉටුකල බවට කිසිදු තොරතුරක් ඉදිරිපත් නොවිය. කෙසේ වෙතත් මොවුන්ගේ සේවය දැනට නතර කර ඇත.

(ඇ) කාර්ය මණ්ඩල පුහුණු පාඨමාලා පැවැත් වීම

2009 මාර්තු 26 දිනැති අංක 125/09 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාර පුහුණුවට සහභාගි වන අයට උදෑසන හා රාත්‍රී ආහාරය ලබා නොදෙන විට පමණක් දීමනා ගෙවිය හැකි වුවත් ආහාර හා නවාතැන් පහසුකම් ලබාදී තිබියදී රු.205,100 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඈ) පුත්තලම, මඩකලපුව හා නුවරඑළිය දිස්ත්‍රික්කවල පාඨමාලා ශක්තිමත් කිරීම, නව පාඨමාලා හඳුන්වාදීම හා උපදේශකයින් හා නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා වූ ව්‍යාපෘතියකට හින්දුස්ථාන් මැෂින් මෙවලම් ජාත්‍යන්තර (HMTI) ව්‍යාපෘතිය මගින්

රු.502,949,307 ක මූල්‍ය හා උපකරණ ආධාර ලබාදී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මඩකලපුව හා නුවරඑළිය දිස්ත්‍රික්කවලට ලබාදෙන ලද රු. 29,921,663 ක් වූ උපකරණ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් වී නොතිබුණි. මඩකලපුව වනතරුමුලෙයි මධ්‍යස්ථානයට ලබාදී තිබූ භාණ්ඩ අස්ථානගතවී තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය මගින් සම්පත් ලබාදුන් පාඨමාලාවල පුහුණු වූ ආධුනිකයන්ගේ සංඛ්‍යාවේ අඩුවක් නිරීක්ෂණය විය.

(iii) ව්‍යාපෘතිය මගින් විදේශීය පුහුණුවක් ලැබූ නිලධාරියකු ඉල්ලා අස්වී තිබූ නමුත් ගිවිසුම කඩ කිරීම නිසා ශිෂ්‍යත්වය සඳහා වැය කල රු.1,064,492 ක මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මෝටර් කාර්මික ශිල්පී පාඨමාලාව සඳහා රු.83,857,040 ක පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා 2012 පෙබරවාරි හා මැයි මාසයේදී භාණ්ඩ ඇණවුම් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර මිල ගණන් කැඳවා භාණ්ඩ ඇණවුම් කිරීමට මාස 04 සිට 06 ක කාලයක් ගතවී තිබුණි.

(ii) 2012 පෙබරවාරි හා මැයි මාසයේ සිදු කරන ලද ඇණවුම්වලට අදාල භාණ්ඩ පිළිවෙලින් 2013 මැයි හා අගෝස්තු මාසය වන විටත් සපයා නොතිබුණි.

(iii) 2012 පෙබරවාරි මාසයේ සිදුකල අංක 18 දරන ගැණුම් ඇණවුමට අදාල භාණ්ඩ නියමිත දිනයට නොසැපයීම හේතුවෙන් 2012 ජුනි මාසයේදී එය අවලංගු කරන බව අධිකාරිය විසින් සැපයුම්කරු වෙත දන්වා තිබූ පසු සැපයුම්කරු විසින් 2012 ජූලි 10 ත් 15 ත් අතර දිනයන්හි උපකරණ සපයන බවට එකඟ වී තිබුණි. නමුත් එම කාලය තුළදිද උපකරණ සපයා නොතිබූ අතර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය පරිදි ඇපකරය මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) වටිනාකම රු.6,840,673 ක්වූ එක් අයිතමයකට අදාල තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව 2013 ජූලි මාසය දක්වාත් ලැබී නොතිබුණත් රු.6,090,768 ක් වූ අයිතම

08 ක් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 2012 ජූලි මාසයේ ප්‍රතික්ෂේප කර තිබුණද එම උපකරණ 2013 ජූලි 31 දින දක්වාත් නැවත සපයා නොතිබුණි.

(v) වටිනාකම රු. 47,322,040 ක්වූ අංක 66 දරන ගැණුම් ඇණවුම 2012 ඔක්තෝබර් 04 දින ප්‍රසම්පාදන කමිටුව විසින් අවලංගු කිරමට තිරණය කර තිබුණද එසේ තිරණයක් ගෙන නොමැති සේ සලකා ඉදිරි කටයුතු කරන ලෙස සභාපතිවරයා විසින් 2012 ඔක්තෝබර් 16 දින දන්වා තිබුණි. ප්‍රසම්පාදන කමිටුවේ තීරණයට පටහැනිව සභාපතිවරයා කටයුතු කර තිබු බවත් ඇණවුම් කල උපකරණ වර්ග 19 කින් සපයා තිබුණේ උපකරණ වර්ග 03 ක් බවත් විගණනයේදි අනාවරණය විය. එසේම සපයා තිබු භාණ්ඩ පිරිවිතරවලට අනුකුල නොවු අතර ඇතැම් උපකරණද දෝෂ සහිත බැවින් යම් යම් සීමා කිරීම් සහිතව පාවිච්චි කරන ලෙස උපදේශකයින් දැනුවත් කර තිබුණි. ආධුනිකයින්ගේ අතපසුවීම් හා අත්වැරදි නිසා උපකරණවලට හානිවීමේ හැකියාව වැඩි හෙයින් දෝෂ සහිත උපකරණ භාවිතයෙන් වැඩි අවදානමක් ඇති විය හැකි බවත් විගණනයේදි නිරීක්ෂණය විය.

(vi) ප්‍රතික්ෂේප කරන ලද රු.1,938,313 ක් වු උපකරණ වර්ග 16 ක් හා අයිතම අංක 1 යටතේ තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රතික්ෂේප කරන ලද රු.4,099,323 ක් වූ භාණ්ඩ වර්ග 05 ක් 2013 ජූලි මාසය දක්වාත් නැවත සපයා නොතිබුණි.

(vii) වර්ෂයකට අධික කාලයක් භාණ්ඩ සැපයීමට නොහැකිවීම මත මෙම ආයතනය අසාධු ලේඛණයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබු අතර නියමිත උපකරණ නොලැබීම නිසා පුහුණු කටයුතු වසරකට වැඩි කාලයකින් ප්‍රමාද වී ඇති බවද නිරීක්ෂණය විය.

(ඊ) <u>කෙරීගෙන යන වැඩ</u>

(i) 2011 මාර්තු 13 දින වැඩ අවසන් කර භාර දී තිබු තලල්ල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ බේකරි ඒකකය අළුත්වැඩියා කොන්ත්‍රාත්තුවෙහි වටිනාකම වූ රු.2,171,788 ඉක්මවා රු.386,632 ක් වැඩියෙන් වැය කිරීම පිළිබදව එකඟතාවයක් නොමැතිවීම නිසා 2013 දෙසැම්බර් මාසය දක්වාත් අවසන් ගෙවීම සිදු කර නොතිබුණි.

(ii) වටිනාකම රු. 3,661,609 ක් වූ මාපාකඩවැව මධ්‍යස්ථානයේ ඉදිකිරීම 2012 ජනවාරි 05 දින අවසන් කල යුතු වුවත් එය අවසන් කර තිබුණේ 2012 දෙසැම්බර් 28 දිනදිය. වැඩබිම පරික්ෂා කර දුර්වලතා හා අඩුපාඩු පෙන්වා දිමට මාස 05 ක් ගතවී තිබුණි.

(iii) 2011 හා 2012 වර්ෂවල ආරම්භ කරන ලද රු.23,112,752 ක්වූ කොන්ත්‍රාත් 5 ක් මාස 2 1/2 සිට 13 1/2 ක් ප්‍රමාද වී තිබූ නමුත් නියමිත කාලය තුළ නිම නොකරන ලද කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ප්‍රමාද ගාස්තු අයකිරීම හෝ වෙනත් ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඇ) පුහුණු උපකරණ මිලදී ගැනීම

අධිකාරිය විසින් පුහුණු පාඨමාලා ජනවාරි හා ජුලි මාසවල ආරම්භ කරනු ලබන අතර එම පාඨමාලා සඳහා අවශ්‍ය පුහුණු උපකරණ මිලදී ගැනීම ඊට ආසන්න කාලය තුල සිදු කල යුතුය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) උපකරණ ඇණවුම් කල දින සිට සැපයීමට දින 53 සිට 366 දක්වා කාල පරාසයක් ගතවී තිබුණි.

(ii) සැපයුම්කරු භාණ්ඩ සැපයීමෙන් පසුව එම භාණ්ඩ තාක්ෂණික ඇගයීම් කමිටුවකට යොමු කර එහි අනුමැතිය ලැබූ භාණ්ඩ පමණක් භාර ගත යුතු වුවත්, සපයන ලද භාණ්ඩ සමහරක් තාක්ෂණික ඇගයීම් කමිටුවකට යොමු කිරීමෙන් තොරව ගබඩාවට භාර ගෙන තිබුණි. සැපයූ උපකරණ පිරිවිතරවලට අනුකූල බවට වූ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා ලබා ගැනීමට දින 12 සිට දින 334 දක්වා කාල පමාවක් සිදුවී තිබුණු අතර එම වාර්තාව ලැබෙන තෙක් භාණ්ඩ නිකුත් කිරීම සිදුනොකල යුතු වුවත් ඇතැම් අවස්ථාවල ඊට පටහැනිව කටයුතු කර පුහුණු උපදේශකයින්ගෙන් එම භාණ්ඩ හොඳ තත්ත්වයේ පවතින බවට නිර්දේශ ලබාගෙන තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්වලට එළඹී නොතිබුණි.

(ඈ) ගබඩාවේ බින් කාඩ්පත්වල භාණ්ඩ අඩුවෙන් සටහන් කල අවස්ථා මෙන්ම ලැබීම් සටහන් නොකල අවස්ථාවන්ද නිරීක්ෂණය විය. 2011 වර්ෂයේ ප්‍රධාන ගබඩාවේ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගන්නා ලද රු.4,742,905 ක ඌණතාවයක් හා රු.2,304,837 ක අතිරික්තයක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර භාණ්ඩ අයිතම 10 ක ඌනතාවයේ වටිනාකම වූ රු.324,202 ක් අනුමැතියකින් තොරව පොත්වලින් ඉවත් කර තිබුණි. වටිනාකම රු.154,080 ක් වූ භාණ්ඩ අයිතම 04 ක් සමීක්ෂණයට භාජනය කර නොතිබූ අතර ඒවායේ වටිනාකමද ගිණුම්වල දක්වා නොතිබුණි.

(එ) දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයෙන් රු.2,828,711 ක වියදම් දරා තිබුණු අතර ප්‍රදර්ශනයේ රාජකාරිවල නිරත වූ නිලධාරින්ට නවාතැන් හා ආහාර සැපයීම වෙනුවෙන් පිළිවෙලින් රු. 563,000 ක් හා රු. 613,915 ක් ගෙවා තිබියදිත් විශේෂ දීමනා වශයෙන් රු.424,500 ක්ද ගෙවා තිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට ගෙවන ලද මුදලින් අයකල යුතු එකතු කල අගය මත බදු අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබියදිත් තවදුරටත් රු.1,762,076 ක් ගෙවිය යුතු මුදල් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) 2008 සිට 2011 වර්ෂය දක්වා සේවකයන් 04 දෙනෙකු හා 2012 වර්ෂයේ සේවකයන් 12 දෙනෙකු සේවයෙන් ඉවත්ව ගොස් තිබුණද ඔවුන්ට ගෙවිය යුතු රු. 3,843,139 ක් වූ පාර්තෝෂික 2012 දෙසැම්බර් 31 දින දක්වාත් ගෙවා නොතිබුණු අතර එක් සේවකයෙකු කම්කරු විනිශ්චය සභාවේ නඩුවක් පවරා තිබීම නිසා අධිභාර වශයෙන් රු. 109,908 ක්ද ගෙවීමට සිදුවී තිබුණි. පාර්තෝෂික පනත ප්‍රකාරව නියමිත දිනට පර්තෝෂික නොගෙවීම නිසා ඉදිරියේදීත් අධිභාර ගෙවීමට සිදුවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) උපසභාපතිවරයාගේ ආහාර හා නවාතැන් පහසුකම් සඳහා රු. 40,000 ක අත්තිකාරමක් ලබාගෙන රු 40,505 ක වියදමක් දරා තිබියදිත් ඊට අමතරව එම කරුණ සඳහාම තවත් ආයතනයකට රු.44,000 ක් ගෙවා තිබුණි.

4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2011 වර්ෂය හා ඊට පෙර මිලදී ගන්නා ලද භාණ්ඩ අයිතම 532 ක් 2013 පෙබරවාරි මාසය දක්වාත් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

4.5 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) තනතුරුවලට පත් කිරීමේදී ආරම්භක පියවරට වඩා ඉහළ වැටුප් පර්මාණ ලබාදීම හේතුවෙන් අවස්ථා 80 කදී නිලධාරින්ට වැටුප් වශයෙන් රු.6,079,090 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) විශ්‍රාම ගිය සේවකයකුගෙන් අය විය යුතු රු.10,934 ක දුරකථන ගාස්තු අය කර ගෙන නොතිබුණි.

(ඇ) නියමිත දිනට ආදායම් බලපත්‍ර ලබා නොගැනීම නිසා වාහන 07 ක් වෙනුවෙන් රු. 8,100 ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණි.

4.6 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ ප්‍රධාන තෙමහල් ගොඩනැගිල්ලේ පිටත ආවරණය කිරීම (Cladding work) සඳහා වූ රු.32,095,280 ක කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මෙම කොන්ත්‍රාත්තුව සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබූ අතර එක් මිල ගණනක් පමණක් ලබා ගෙන තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.2 ඡේදය අනුව මාස 03 ඉක්මවන වැඩ සඳහා මිල විචලනයන් සලකා බැලිය හැකි වුවද කොන්ත්‍රාත් කාලය දින 45 ක්වූ මෙම කොන්ත්‍රාත්තුව සඳහා රු. 4,206,825 ක් මිල විචලනය සඳහා ගෙවා තිබුණු අතර එය ගිවිසුම් ගත කොන්ත්‍රාත් මුදලින් සියයට 13.11 ක් විය.

(ඇ) ගිවිසුම ප්‍රකාරව 2012 ජනවාරි 14 දින මෙම කාර්ය අවසන් කල යුතුව තිබුණද, එය අවසන් කර තිබුණේ දින 333 ක කාල ප්‍රමාදයක් යුතුව විය.

(ඈ) මෙම කාර්ය නිසා (Cladding work) ගොඩනැගිල්ලේ බාහිර පෙනුම පමණක් වෙනස් වන නමුත් ඵලදායිතාවය වැඩිවන අයුරින් ඉඩ කඩ හෝ වෙනත් පහසුකම් කිසිවක වර්ධනයක් සිදු නොවන බැවින් මේ සඳහා රුපියල් මිලියන 35 කට අධික මුදලක් වැය කිරීම අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය.

4.7 <u>වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳව සැලකිල්ලක් නොදක්වා අධිකාරියේ සේවකයින් 25 දෙනෙකු අමාත්‍යාංශයට සහ වෙනත් බාහිර ආයතන කිහිපයකට නිදහස් කර තිබුණි. එසේම අධිකාරියට කිසිදු සේවාවක් සිදු

නොවී තිබියදී ඔවුන්ගෙන් 20 දෙනෙකු සඳහා වැටුප් හා දීමනා වශයෙන් රු.4,446,919 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි. මෙම සේවකයන්ගෙන් සමහරෙක් වර්ෂ 1 සිට 17 දක්වා වූ කාලයක් නිදහස් කර තිබූ බවත් බඳවාගත් දින සිට සේවයෙන් නිදහස් කර තිබූ අවස්ථා 17 ක් වූ බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) උපදේශකයන් 9 දෙනෙකු මුදාහැර තිබුණු අතර බඳවා ගැනීමේ අරමුණුවලට හා පත්වීම් ලිපිවල සඳහන් කොන්දේසි අනුව කටයුතු කර නොතිබුණි. මේ හේතුව නිසා පාඨමාලාවලට අවශ්‍ය උපදේශකයින් බඳවා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) සේවයෙන් මුදාහල නිලධාරියෙකුගෙන් වාහන අනතුරක් සම්බන්ධයෙන් අයවිය යුතු රු.135,744 ක් මුදාහැරීමට පෙර අයකර ගෙන නොතිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව වාහන තුනක් වෙනත් ආයතනවලට නිදහස් කර අළුත්වැඩියාව හා නඩත්තු වියදම් වශයෙන් අධිකාරියෙන් රු. 299,466 ක් වැයකර තිබුණි.

## 4.8 කාර්යය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඉකුත් වර්ෂය සමග සසඳා පහත දැක්වේ.

| සේවක වර්ගය | 2012 | | | 2011 | | |
|---|---|---|---|---|---|---|
| | අනුමත | තථ්‍ය | අතිරික්තය/ (ඌනතාවය) | අනුමත | තථ්‍ය | අතිරික්තය/ (ඌනතාවය) |
| විධායක | 11 | 8 | (3) | 11 | 09 | ( 2) |
| මාණ්ඩලික | 87 | 59 | (28) | 78 | 54 | ( 24) |
| වෙනත් | 1,830 | 1,673 | (157) | 1,842 | 1,691 | (151) |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ බඳවා ගැනීම් පටිපාටියකින් තොරව අනියම්, කොන්ත්‍රාත් සහ ස්ථිර පදනම මත සේවකයින් 37 ක්ද, ඉකුත් වර්ෂයේ 43 ක්ද බඳවාගෙන තිබුණු අතර, ඒ සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවීම හා බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා 2008 සිට සමෘද්ධි අධිකාරියට මුදාහැර තිබූ අතර 2011 සිට එම තනතුරේ වැඩ බැලීමට හෝ නිලධාරියකු පත්කර නොතිබුණි.

(ඇ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට අනුව ගණකාධිකාර් තනතුරු 2 ක් වු අතර එම තනතුරු 2010 සැප්තැම්බර් මාසයේ හා 2011 අගෝස්තු මාසයේ සිට පුරප්පාඩුව පැවතුණි.

(ඈ) දිස්ත්‍රික් කාර්යාල හා ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 33 ක අධ්‍යයන කාර්ය මණ්ඩලය 1,110 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය 601 ක් විය. එක් මධ්‍යස්ථානයකට 4 සිට 51 දක්වා වු පරාසයක අනධ්‍යයන කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණු අතර පවත්වා තිබුණු පාඨමාලාවලට අතිරේකව අධ්‍යයන කාර්යය මණ්ඩලයද අනුයුක්ත කර තිබුණි. මේ අනුව අධ්‍යයන කාර්යය මණ්ඩලය 234 දෙනෙකු නිෂ්කාර්යව සිටි බව නිරීක්ෂණය විය.

(ඉ) උපදේශක කාර්යය මණ්ඩලයේ 49 දෙනෙකු ආයතනයේ ප්‍රධාන අරමුණෙන් බැහැර වු රාජකාරි කටයුතුවල නිරතව තිබුණි.

(ඊ) අදාල විෂය පිළිබඳ පාඨමාලාව නොපවත්වනු ලබන මධ්‍යස්ථානවලට උපදේශකයින් අනුයුක්ත කර තිබුණු අතර එකම පාඨමාලාවට උපදේශකයින් එක් අයෙකුට වඩා අනුයුක්ත කළ අවස්ථාවන්ද විය.

(උ) සමාලෝචිත වර්ෂයේ සේවකයන් ලබාගෙන තිබුණු වැටුප් රහිත නිවාඩු පිළිබඳ විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණු අතර උපදේශක කාර්ය මණ්ඩලයේ 25 දෙනෙකු වැටුප් රහිත නිවාඩු දින214ක් ලබා ගෙන තිබුණි. මෙසේ උපදේශකයන් අධික ලෙස නිවාඩු ගැනීම පාඨමාලා හදාරන ආධුනිකයින්ගේ පුහුණු කටයුතුවලට අහිතකර බලපෑමක් සිදු කරන බව විගණනයේදි නිරීක්ෂණය විය.

(ඌ) පුහුණු කටයුතුවල නොයෙදෙන උපදේශකයින් එම පුහුණු මධ්‍යස්ථානයන්හි රඳවාගෙන වැටුප් ගෙවීම නොකළ යුතු බවත් එලෙස මාස 02 ක් ඉක්මවා වැටුප් ලබා ගන්නේනම් ඒ සඳහා අමාත්‍යංශයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බවත් අමාත්‍යංශ ලේකම්වරයා විසින් උපදෙස් ලබාදි තිබුණද ඒ අනුව කටයුතු නොකර වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

4.9 වාහන උපයෝජනය

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2006 ජූලි 14 දිනැති අංක 11/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව නිලධාරින්ට හිමි ඉන්ධන දීමනාව මාසිකව එකවර ගෙවිය යුතු වුවද අධිකාරියේ හිටපු සභාපතිවරයා හා හිටපු උප සභාපතිවරයා වෙත ඉන්ධන දීමනා ගෙවීමේදි එලෙස සිදු නොකර ඒ වෙනුවට සංචිතයේ ඉන්ධන අග්‍රිමය මගින් එම වාහනවලට ඉන්ධන ලබාදී තිබුණි. මේ ආකාරයට හිටපු

සභාපතිවරයා විසින් මාසිකව හිමි ඉන්ධන දීමනාව ඉක්මවා රු.107,984ක ඉන්ධන ලබාගෙන තිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව බී-ශ්‍රේණියේ රාජ්‍ය සංස්ථාවක නිල වාහන වෙන් කළ හැකි නිලධාරීන් නොවන 5 දෙනෙකුට නිල වාහන ලබාදී 2012 හා 2011 වර්ෂවල පිළිවෙලින් රු.563,360 ක් හා රු.537,480 ක් ඉන්ධන සඳහා වැය කර තිබුණි.

(ඇ) අංක19-9958 දරන වාහනය 2008 සැප්තැම්බර් 07 වෙනි ඉරිදා අනතුරට පත්වී තිබුණු අතර එදින මෙම රථය යොදවා ගෙන තිබුණු රාජකාර්ය පිළිබඳ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවුණි. රථය අළුත්වැඩියාව සඳහා ලැබුණු රක්ෂණ වන්දි මුදලට වඩා වැයවූ රු.198,724 අනතුර සම්බන්ධව වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.වාහනය අළුත්වැඩියා කර ආපසු අධිකාරිය වෙත රැගෙන ඒමට මාස 58 කට අධික කාලයක් ගතවී තිබූ අතර එය 2013 සැප්තැම්බර් මාසය දක්වාත් රාජකාර් සඳහා යොදවා ගෙන නොතිබුණි.

(ඈ) වාහන අළුත්වැඩියාවන් කිරීමෙන් පසු ගෙවීම් කිරීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම, අළුත්වැඩියාව නිසි පරිදි සිදු කර නොතිබීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 2 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම, යාවත්කාලීන කරන ලද වාර්ෂික අයවැය සමග මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් 2012 සහ ඉන් ඉදිරියට බලපැවැත්වෙන ආකාරයට සකස් කරන ලද සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඉදිරිපත් කර තිබුණේ 2012 මාර්තු 02 දිනදීය.

5.2 අයවැය පාලනය

සංශෝධිත අයවැය ලේඛණයේ ඇස්තමේන්තු ගත ආදායම් සහ වියදම් හා තථ්‍ය ආදායම් සහ වියදම් අතර, සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරවා ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුවිය යුතුව ඇත.

(අ) ස්ථාවර වත්කම්
(ආ) මුදල් හා බැංකු කටයුතු
(ඇ) ගිණුම්කරණය
(ඈ) වාහන පාලනය
(ඉ) අත්තිකාරම් සහ මිලදී ගැනීම්
(ඊ) ණයගැතියෝ සහ ණයහිමියෝ
(උ) කාර්ය මණ්ඩල කළමණාකරනය
(ඌ) ගබඩා පාලනය
(එ) ආධුනික පුහුණු කටයුතු

එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති

විගණකාධිපති,

**<u>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>**

2.2.1 එකඟ නොවෙමි.

ඉදිරිපත් කරන ලද අවසාන ගිණුම් වාර්තාවේ රු.2000ට අඩු අයිතම ප්‍රාග්ධනිත කර නොමැත. HMTI විදේශාධාර යටතේ ලැබුණු උපකරණ ලැයිස්තුවේ එලෙස සඳහන් කර තිබුණත් එහි නියෝජනය වූ රු.2,000ට අඩු උපකරණ අයහාර වියදම් ලෙස සටහන් කර ඇත.

2.2.2 (අ) එකඟ නොවෙමි.

මෙලෙස දරන ලද වියදම් හේතුවෙන් අදාල වාහනවල වටිනාකම වැඩිවීමක් ඇති වන හෙයින් මෙය ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර ඇත.

(ආ) එකඟ වෙමි.

පාරිතෝෂිත වෙන් කිරීම් 2013/12/31 දිනට නිවැරදිව ගණනය කොට නිවැරදි කිරීමට කටයුතු කරන ලදි.

(ඇ) මෙම සේවකයන් සේවයෙන් ඉවත් වුවද අවසාන මස වැටුප් ගෙවා ඔවුන් සේවයෙන් නිදහස් කර නොමැත. ඒ අනුව එම අයවිය යුතු නිළධාරින්ගෙන් කිහිප දෙනෙක් අවසාන වැටුප් ගෙවා නිදහස් කරන අවස්ථාවේදි ඔවුන්ගේ පාරිතෝෂික මුදලින් අයවිය යුතු ණය අයකර ගෙන ඇත.තව දුරටත් අයවිය යුතු ශේෂ සම්බන්ධයෙන් 2014 වර්ෂයේදි නිරවුල් කර ගැනීමට කටයුතු කරනු ඇත.

(ඈ) වැරදිමකින් 2011 වර්ෂයේදි මෙම සේවකයින් 07 දෙනාට පාරිතෝෂික සඳහා වෙන් කිරිම් නොතිබුනු අතර 2012 වර්ෂයේදි ඒ සඳහා වෙන් කිරීම් කර ඇත.

ගෙවා අවසන් කරන ලද රු.112,227.00 වැරදිමකින් ගිණුම් වල ඉදිරියට ගෙනවිත් ඇති අතර 2013 වර්ෂයේදි මෙය නිවැරදි කරන ලදි.

(ඉ) එකඟ නොවෙමි.

මෙම 2011 වර්ෂයට අදාල රු.9,669,450/- මුදල අනුමත පාඨමාලා හැරයාම් වන බැවින් එම වටිනාකම ලැබිය යුතු ශේෂය ලෙස ඉදිරියට ගෙන යාමට නොහැකි වන බැවින් එම වටිනාකම ගිණුම් වලට ගලපා ඇත.

(ඊ) මෙම වටිනාකම ඇප තැන්පතුවක් ලබා ගෙන කර ඇති අත්තිකාරමක් වන අතර 2013.04.30 දින වන විට භාණ්ඩ ලැබී සියලුම ගෙවීම්ද නිරවුල් කර ඇත.

(උ) පිළිගනිමි. 2013 වර්ෂයේ සිට වැටුප් රහිත නිවාඩු එම වර්ෂය තුළදී ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.

(ඌ) මෙම අයකර ගත යුතු වැටුප 2012 වර්ෂයේදී අයකර ගතයුතු මුදලක් ලෙස ගිණුම්ගත කර ඇත.

(එ) ඉදිරියේදී මෙම පුස්තකාල පොත්වල වටිනාකම ගණනය කොට ගිණුම්ගත කොට ඔබ වෙත වාර්තා කරමි.

(ඒ) i) සමාලෝචිත වර්ෂයේදී දුරකථන ගාස්තු වශයෙන් අයවිය යුතු රු.942,783.00 අය නොකිරීම.

මෙම අධිකාරිය මගින් නිකුත් කර ඇති 2012/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව දුරකථන සීමා ඉක්මවන සෑම අවස්ථාවකදීම දුරකථන භාර නිලධාරියාගේ වැටුපෙන් අයකළ යුතු බව පිළිගනිමි. පහත නම් සඳහන් නිළධාරීන් දෙදෙනාගේ මාසික රාජකාරි නිවාස දුරකථන සීමාව රු.2000.00 කි.

කේ.ජේ.කෝරළගේ මහතා - අධ්‍යක්ෂ

මහින්ද ජයතිලක මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ

නමුත් ඔබ විසින් ඔවුන්ගේ රාජකාරී නිවාස දුරකථන සීමාව රු.1000.00 ලෙස සලකා ගණනය කිරීම් කර ඇත. ඒ අනුව ඔවුන් විසින් සීමාව ඉක්මවා දුරකථන භාවිතා කර නොමැත. එසේම අනෙකුත් නිළධාරීන් සම්බන්ධ විස්තර මේ සමඟ අමුණා ඇති ලේඛනයේ දක්වා ඇත. (ඇමුණුම අංක 01)

එකී ලේඛනය අනුව අනුමත රාජකාරී මාසික දුරකථන සීමාව රු.4000.00 කි. එක් එක් මාසයන් වෙන් වෙන්ව ගත්විට අදාළ මාසික සීමාව ඉක්මවා ඇති බව පෙනෙන නමුත් බොහෝ දිස්ත්‍රික් මධ්‍යස්ථාන වල මුළු වර්ෂය පොදුවේ සලකන විට සීමාව ඉක්මවා නැත. අදාළ විස්තර ඇතුළත් ඇමුණුම 01 අනුව සත්‍ය වශයෙන්ම මාසික රාජකාරී දුරකථන සීමාව ඉක්මවා ඇත්තේ පහත නම් සඳහන් රාජකාරී ස්ථාන වල පමණි.

1. සහකාර අධ්‍යක්ෂ - නාරාහේන්පිට වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය.
2. පුත්තලම - දිස්ත්‍රික් කාර්යාලය.
3. ගම්පහ - දිස්ත්‍රික් කාර්යාලය.
4. කළුතර - දිස්ත්‍රික් කාර්යාලය.
5. රත්නපුර - දිස්ත්‍රික් කාර්යාලය.
6. මඩකලපුව - දිස්ත්‍රික් කාර්යාලය.
7. ගාල්ල - දිස්ත්‍රික් කාර්යාලය.

සීමාව ඉක්මවා ඇති ප්‍රමාණයන් අදාළ නිලධාරීන්ගෙන් අයකිරිමට කටයුතු කෙරේ.

ii) 2009 වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු.151437.00 ක මුදල චක්‍රලේඛ සීමාවන්ට යටත්ව අදාළ නිලධාරීන්ගෙන් අයකර ඔබ වෙත වාර්තා කරනු ලැබේ.

දුරකතන ගාස්තු රු.1,334,385.00 ක මුදල අත්හැරීමකින් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස කපාහැර ඇති අතර ඉදිරියේදී මෙවැනි අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ඇත.

(ඔ) මෙම ගොඩනැගිලි 2012 වර්ෂයේ ගෙවීම් කටයුතු අවසන් කර ඉදිකිරීම් අංශය මගින් පරික්ෂා කර බලා භාර ගෙන නොතිබු බැවින් 2012 වර්ෂයේ කරගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. මේ වන විට ගෙවීම් කටයුතු ද අවසන් කර ඇති බැවින් 2013 වර්ෂයේදී ගොඩනැගිලි ගිණුමට ගැලපීම් කර ඇත.

(ඕ) වැටුප් රහිත විදේශ නිවාඩු වශයෙන් පාරිතෝෂික මුදලින් අයකර ගන්නා ලද රු 54,468.00 ක මුදල පාරිතෝෂිත ගිණුමට ගිණුම් ගත කර ඇත.

(ක) පිළිගනිමි. මින් ඉදිරියට මෙවැනි වැරදි සිදු නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(ග) එකඟ නොවෙමි.

2013 වර්ෂයේ විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් සිදු කර ඇති අතර එය අවසාන ගිණුම්වල උපචිත වියදම් වල පෙන්වා ඇත.

(ජ) බඳවා ගන්නා ලද ආධුනික සංඛ්‍යාව අනුව සියලුම ලියාපදිංචි ගාස්තු ගිණුම් ගත කර ඇති අතර මෙහි දැක්වෙන ආධුනිකයින් 2399 ගණනය කර ඇත්තේ කාර්ය සාධන වාර්තාව පදනම් කර ගෙනය. 2013 වර්ෂයේ සිට කාර්ය සාධන වාර්ථා සංඛ්‍යාව හා අවසාන ගිණුම් වල පෙන්වන සංඛ්‍යාව සැසඳීම් කිරිම සඳහා අභ්‍යන්තර වැඩපිළිවෙලක් යොදා ඇත.

(ට) ඉදිරියේදී පුවත්පත් දැන්වීම් පලකරනු ලබන වර්ෂයේ දීම එම ගණුදෙනු සිදුකිරීමට මෙන්ම ගිණුම්ගත කිරීමටද කටයුතු කරනු ලැබේ.

2.2.3

(අ),(ආ)

මෙම ශේෂයන් අධිකාරිය යටතේ සහ රේඛිය අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වලින් ලැබිය යුතු ශේෂයන් වන අතර එම ශේෂයන් අයකර ගැනීම ද ගැටළු සහගත තත්වයක් පවතී. මේ වන විට ඒ සම්බන්ධව වාර්තාවක් අධ්‍යක්ෂ මුදල් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන අභ්‍යාන්තර විගණනකට මේ සම්බන්ධ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැන්වීමෙන් අනතුරුව අදාල වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කෙරුණු අතර එහිදි ඉදිරිපත් වූ කරුණු අනුව ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් ලබා දී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට කටයුතු කරනු ඇත.

(ඇ) මේ ශේෂයන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ලබාගැනිම සඳහා සියළු තොරතුරු ඇතුලත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් අධ්‍යක්ෂ මුදල් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් වලට අනුව මෙය නිරවුල් කිරිමට මේ වන විට කටයුතු කරමින් පවති.

(ඈ) මෙම නිලධාරීන් තිදෙනා සම්බන්ධයෙන් පසුගිය කාලය තුළ තානාපති කාර්යාල මෙන්ම ආගමන විගමන පාලක වෙතින්ද අදාල ප්‍රදේශීය ලේකම්වරු වෙතින්ද අදාළ නිලධාරීන් පදිංචි ග්‍රාම නිලධාරීන්ගෙන්ද විස්තර විමසන ලදි, එසේ වුවත් ඔවුන් පිළිබඳ ප්‍රමාණවත් තොරතුරක් සපයා ගැනීමට අපහසු විය.එබැවින් මේ පිළිබඳව අමාත්‍යාංශ ලේකම් විමසන ලදුව වගකිව යුතු නිලධාරීන් ගෙන් කරුණු විමසන ලෙස ලබා දුන් උපදෙස් මත කටයුතු කර ඇත.

(ඉ)

| විස්තරය | මුදල | පැහැදිලි කිරිම් |
|---|---|---|
| පියවර්ධන සහ සමාගම | 1,762,076.00 | මෙම කාර්යය වර්ෂයේදී සිදු කල 2009 වර්ෂයේදී මුල කාර්ය සඳහාම ප්‍රතිපාදන වෙන් කර ඇති අතර මේ සඳහා ගෙවීම් සිදු නොකරන බැවින් මෙය ගිණුම් වලින් ඉවත් කිරිමට කටයුතු කරමි. |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත් | 293,064.44 | ආපසු ගෙවිය යුතු ඇප තැන්පත් හා රඳවා ගත් මුදල් නිදහස් කිරිම සිදු කරනුයේ අදාල පාර්ශවය විසින් ඉල්ලීම් කිරිම සිදු කල පසුවයි. මේ සඳහා සැපයුම්කරුවන් විසින් ප්‍රතිචාර නොදක්වන්නේ නම් එම ශේෂය අදායම් ගිණුම් වලට ගැලපීමට 2013 වර්ෂයේදී කටයුතු කර ඇත. |
| රඳවා ගත් මුදල් | 4,319,901.16 | |

**2.2.4 ඉඩම්**

**විගණන විමසුමේ සඳහන් කර ඇති ගොඩනැගිලි ඉදි කර ඇති මධ්‍යස්ථාන 26හි ඉඩම් වල තත්වය මෙසේය.**

| | |
|---|---|
| රජයේ ඉඩම් වල මධ්‍යස්ථාන | 22 |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් වල මධ්‍යස්ථාන | 02 |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම් වල මධ්‍යස්ථාන | |

ඒ ඒ මධ්‍යස්ථාන පිහිටි ඉඩම් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට පවරා ගැනිම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග මේ සමග අමුණා ඇති උප ලේඛනයේ අංක 2 හි දැක්වේ.

මීට අමතරව රජයේ ඉඩම් වල පවත්වා ගෙන යනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටි ඉඩම් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට පවරා ගැනිම සම්බන්ධයෙන් 2013.11.20 දින ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේදි ,එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ඉඩම්)ගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේදි දැනටමත් ශ්‍රී ලංකා වෘත්තීය

පුහුණු අධිකාරිය විසින් ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම් පළමුව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට පවරා දීමටත් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ගොඩනැගිලි ඉදිකර නොමැති මධ්‍යස්ථාන දෙවනුවට පවරා දීමටත් කටයුතු කල හැකි බව අතිරේක ලේකම් )ඉඩම් (දැන්වීය.ඒ සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ගොඩනැගිලි ඉදිකර ඇති මධ්‍යස්ථාන සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ගොඩනැගිලි ඉදිකර නොමැති මධ්‍යස්ථාන වෙන වෙනම ලේඛණ ගත කර එම ඉඩම් මැනිම සඳහා මිනින්දෝරු මහතුන් තෝරා ගෙන ඔවුන්ගේ නම සහ ලිපිනයන් සමග එම් ලේඛණ තමන් වෙත ඉදිරිපත් කරන ලෙස අතිරේක ලේකම් (ඉඩම්) විසින් උපදෙස් දී ඇත .එම උපදෙස් අනුව කටයුතු සිදු කෙරෙමින් පවති.

| විෂය | වටිනාකම | පිළිතුර |
|---|---|---|
| | | |
| තොගය | 27,743,985 | සියලුම උපලේඛන විගණනයට ඉදිරිපත් කර ඇත. |
| ලැබිය යුතු ශේෂය | 28,737,083 | මෙම ශේෂයන් 2006 ට පෙර ශේෂයන් වන බැවින් ඒ සඳහා ශේෂ සනාථ කිරීම් ලබා ගැනීම ප්‍රායෝගිකව අපහසුය. |
| ප්‍රවර්ධන වියදම් | 340,272 | සමරු කලාපය සඳහා දැන්වීම් අනුග්‍රහය - 50.000<br>පුවත්පත් දැන්වීමක් පළකිරීම - 200,000<br>ආධුනිකයන් බඳවා ගැනීම වෙනුවෙන්<br>ගැසට් පත්‍රයේ දැන්වීමක් පළකිරීම - රු.90,272 මේ සඳහා වෙනම ලිපි ගොනුවක් නොමැති අතර අදාළ ලියකියවිලි වවුචර් පත් වල අමුණා ඇත. |
| ප්‍රවර්ධන වියදම් | 256,000 | මෙම වවුචරය විගණනයට ඉදිරිපත් කර ඇති අතර මෙය විගණන පරික්ෂාවට ලක් කර ඇත. |
| වියදම් (සැලසිනෝ) | 6,500,000 | මේ සම්බන්ධව විධිමත් ලිපිගොණුවක් |

| | | |
|---|---|---|
| | | සොයා ගත නොහැකි වූ අතර ලිපි හුවමාරු වීම් තොරතුරු ඇසුරින් ගොණුවක් සකසා තිබූ අතර එම ගොණුවේ බිල්පත් ඇමුණුම් වශයෙන් දක්වා ඇත.මේ කාර්යය සඳහා අධිකාරියේ මුදල් යොදවා නොමැති බවද මේ සඳහා සැලසිනේ ආයතනය විසින් තවදුරටත් ඉල්ලුම් කරන බැවින් මෙම ඉතිරි මුදල් මෙලෙස ගිණුම් වල පෙන්වා ඇත. |

ඉන්ධන : 13,826,300 සංඛ්‍යාව 141 ලෙස දක්වා ඇති නමුත් අධිකාරියට අදාළ වාහන සංඛ්‍යාව 135කි.

පහත අංක දරණ වාහන මෙම අධිකාරියට අදාල වාහන නොවන බව කාරුණිකව දැනුම් දෙමි.

59-0097 250-0663 58-1310 64-7724

NB-6110 YQ-8756

පහත සඳහන් වාහන වලට අදාළ දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර ඇත.

| | | | |
|---|---|---|---|
| JQ-2949 | XH-5247 | 63-0316 | PC-0994 |
| XH-4974 | XH-4991 | XH-4980 | XH-5109 |
| XH- 5239 | PC-0997 | XH- 4970 | XH- 5112 |
| 32-2836 | LF-8828 | XH- 4957 | XH- 5188 |
| 56-4647 | YI-8351 | PE-1488 | XH- 5181 |
| XH- 5103 | 54-9655 | NB-3507 | WL-0915 |
| 64-9724 | 32-2837 | UK-7814 | YV-5649 |
| YI-8327 | PC-1086 | PE-0195 | UL-4371 |
| XH- 5011 | XH- 4964 | YV-5648 | QM-5038 |
| XH- 5099 | XH- 5193 | 31-6020 | NA-9803 |
| QD-3612 | YV-5650 | XH- 5003 | PB-6243 |
| NA-7309 | 301-8723 | PC-2213 | |

| | | | |
|---|---|---|---|
| KR-1063 | PC-2221 | 19-9959 | KI-2558 |
| PC-5371 | KI-3601 | PC-2217 | 251-7985 |
| YI-8345 | 56-4644 | 64-1602 | 51-6016 |
| LF-8829 | 59-0271 | 19-6176 | LF-8827 |
| PE-1491 | 32-2835 | 56-4622 | 64-3186 |

LF-7340 → LE-7340 ලෙස නිවැරදි විය යුතුය .

VI-8343 → YI-8343 ලෙස නිවැරදි විය යුතුයි.

LF-7345 → LE-7345 ලෙස නිවැරදි විය යුතුයි.

පහත සඳහන් අංක වලට අදාල වාහන සම්බන්ධ ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. ඒ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ගෙන් නිදහසට කරුණු විමසා ඇති අතර අදාළ ධාවන සටහන් ලබා දීමෙන් පසුව නොපමාව විගණනයට ඉදිරිපත් කරමි. (අදාල විස්තර /ඇමුණුම 03)

| | | | |
|---|---|---|---|
| WL-0889 | PC – 5376 | XH- 5129 | 62-5483 |
| 31-6015 | XH- 4985 | YV-5639 | 62-4814 |

YK-9746 → WK-9746 ලෙස නිවැරදි විය යුතුයි

පහත සඳහන් අංක වලට අදාල වාහන පසුගිය කාලය තුළ ධාවනයට යොදා ගෙන නැත .අදාල විස්තර පහතින් සඳහන් කර ඇත.

| | | |
|---|---|---|
| PA-1227 | - | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. |
| 18-5640 | - | ආධුනික ප්‍රායෝගික පුහුණුව සඳහා ලබා දී ඇත. |
| 300 - 2814 | - | අධික ඉන්ධන දහනයක් සහ ධාවනයට සුදුසු තත්වයේ නොතිබූ බැවින් ධාවනයට යොදා ගෙන නොමැත. |
| KI-2563 | - | ගරු අමාත්‍යතුමාගේ රාජකාරී සඳහා ලබා දී ඇත. |

| | | |
|---|---|---|
| 19-9958 | - | අළුත්වැඩියා සඳහා යොමු කර තිබිණි. |
| 59-0267 | - | මෙය කැබ් රථයකි .2002 වර්ෂයේදී අනතුරකට භාජනය වී ඇත . |
| 31-6018 | - | දැනට ධාවනය නොකෙරේ .ආධුනික ප්‍රායෝගික පුහුණුව සඳහා ලබා දීමට තීරණය කර ඇත. |
| 62-2015 | - | අළුත්වැඩියාව සඳහා යොමු කර තිබූ බැවින්, ධාවනය නොකරන ලදී . නමුත් මේ වන විට අදාල අළුත්වැඩියාවන් නිම කර මීරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ රියදුරු පුහුණුව සඳහා අනුයුක්ත කර ඇත . |
| 15-5323 | - | පසුගිය කාලය තුළදී ධාවනය කිරීමට නොහැකි තත්ත්වයක තිබූ අතර, මේ වන විට ආධුනික ප්‍රායෝගික පුහුණුව සඳහා යොමු කිරීමට නියමිතය . |
| 60-8860 | - | අනතුරකට ලක්වී ඇති බැවින් ධාවනය නොකෙරේ .(ආධුනික ප්‍රායෝගික පුහුණුව සඳහා ලබා දීමට නියමිතව ඇත.) |
| KI-2565 | - | ක්‍රීඩා අමාත්‍යාංශය සඳහා ලබා දී තිබිණි .මේ වන විට අධිකාරියට නැවත ලබා ගෙන ඇත. |
| 31-6019 | - | මෙය ජීප් රථයකි .ධාවන තත්ත්වයේ නොතිබූ බැවින්, ධාවනයට යොදා ගෙන නැත .මෙම රථයද ආධුනික ප්‍රායෝගික පුහුණුව සඳහා යොමු කිරීමට නියමිතය. |
| 40-7898 | - | ආධුනික ප්‍රායෝගික පුහුණුව සඳහා ලබා දී ඇත. |
| MO-3381 | - | රියදුරු පුහුණුව සඳහා ලබා දී ඇත .නමුත් ධාවනය කර නොමැත. |
| QM-5039 | - | ආධුනික ප්‍රායෝගික පුහුණුව සඳහා ලබා දී ඇත. |
| YV-5653 | - | රියදුරු පුහුණුව සඳහා භාවිතා කිරීමට නියමිතව ඇති අතර, දැනට ධාවනය කර නොමැත. |

| | | |
|---|---|---|
| 53-0490 | - | අළුත්වැඩියාව සඳහා යොමු කර තිබිණි . |
| QM-5040 | - | රියදුරු පුහුණුව සඳහා ලබා දී ඇත .නමුත් ධාවනය කර නොමැත. |
| YV-8010 | - | රියදුරු පුහුණුව සඳහා ලබා දී ඇත .නමුත් ධාවනය කර නොමැත. |
| 62-6616 | - | රියදුරු පුහුණුව සඳහා ලබා දී ඇත .නමුත් ධාවනය කර නොමැත. |
| YV-5651 | - | රියදුරු පුහුණුව සඳහා ලබා දී ඇත .නමුත් ධාවනය කර නොමැත. |

ඇමුණුම 03 හි සඳහන් වාහන වල ධාවන සටහන් මේ වන විට විගණනයට ඉදිරිපත් කර ඇති අතර, මේ වන විටත් ලබා දී නොමැති ධාවන සටහන් ලබා දෙන ලෙස අදාළ නිලධාරීන්ට දන්වා ඇත.

පහත සඳහන් වාහන වලට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි වීමට හේතු අදාළ අංක ඉදිරියෙන් දක්වා ඇත.

| | | |
|---|---|---|
| 26 ශ්‍රී 8167 | - | එන්ජිම අළුත්වැඩියාව සඳහා යොමු කර තිබුණි. |
| 42-5521 | - | |
| 59-0289 | - | |
| 63-3436 | - | අළුත්වැඩියාවට යොමු කර තිබිණි. |

PE-6521 - මෙම වාහනය අමාත්‍යාංශයෙන් තාවකාලිකව ලබා ගන්නා ලදී .2012 වර්ෂයේදී නැවත භාර දෙන ලදී.

වාහන 17 - අදාළ මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් නොකිරීම.

පිළිගනිමි.මෙම තත්වය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු

කරමි.

දැයට කිරුළ - වියදම 3,649,031අදාළ ලිපිගොනුව හා භාණ්ඩ ලබාදුන් බවට සනාථ කෙරෙන ලියවිලි.

අදාළ ලිපිගොනුව හා භාණ්ඩ ලබාදුන් බවට සනාථ කෙරෙන ලියවිලි විගණනයට භාර දීමට කටයුතු කරමි.

ගමන් වියදම් අත්තිකාරම් 400,000 අත්තිකාරම් පියවීම් පිළිබඳ විස්තර

දැයට කිරුළ ප්‍රදර්ශනයේ සඳහා අත්තිකාරම් වශයෙන් රු.400,000 ක් ලබා ගෙන ඇති අතර එකී අත්තිකාරම පියවීම පිළිබඳ වවුචර් පත විගණනය සඳහා ඉදිරිපත් කරමි.

2.2.5 (අ) වාර්ෂික විගණන සැලැස්මෙන් බාහිරව එවකට සිටි සභාපතිවරයා විසින් පවරා තිබූ කාලීන වැදගත්කමක් සහිත වූ විශේෂ රාජකාරී හා විමර්ශන හේතුවෙන් 2012 වසර මුල් කාර්තු 02 තුළ වාර්ෂික විගණන සැලැස්මට අනුකූලව විගණන කටයුතු ක්‍රියාත්මක කිරීමට අවකාශ තිබී නොමැති අතර, විගණන සැලැස්මෙන් බාහිරව එවැනි කාර්යයන් 41 එම කාලය තුළ ඉටුකර ඇත.

මෙම විශේෂ වැඩසටහන් වලට අමතරව එවකට සිටි සභාපතිවරයාගේ උපදෙස් පරිදි විශේෂ විගණන වැඩසටහන් 11ක් දිස්ත්‍රික්ක තුළ සිදුකර අදාල විගණන වාර්තා 11ක් මුල් කාර්තු 02 තුළ ලබා දී ඇත. ඒ අනුව 2012 මුල් කාර්තු 3ට අදාලව විගණන සැලැස්මට අනුව විගණන පරීක්ෂණ සිදු නොකිරීම නිසා විගණන වාර්තා විගණකාධිපති වෙත යොමු කර නැත. 2012 03වන කාර්තුවේ සිට විගණන සැලසුමට ඇතුලත් විගණන කටයුතු 09ක් සිදුකර අතර එකී වාර්තා ඔබ වෙත ඉදිරිපත් කර ඇත. විස්තර පහත පරිදි වේ.

<u>**2012 වර්ෂයේ විගණන වැඩසටහනට අදාල සිදු කරන ලද විගණන කටයුතු**</u>

<u>විස්තර විගණන වාර්තා ඉදිරිපත් කල දිනය</u>

| | |
|---|---|
| පොලොන්නරුව දිස්ත්‍රික් විගණනය | 19.10.2012 |

| | |
|---|---|
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික් විගණනය | 19.10.2012 |
| 2012 වසර තුළ ආරම්භ කිරීමට නොහැකි වූ පාඨමාලා | 06.11.2012 |
| පුත්තලම දිස්ත්‍රික් විගණනය | 22.11.2012 |
| ප්‍රවාහන කටයුතු විගණනයට ලක් කිරීම | 05.12.2012 |
| නාරාහේන්පිට ජාතික වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන විගණනය | 12.12.2012 |
| අනුරාධපුර දිස්ත්‍රික් විගණනය | - |
| කුරුණෑගල දිස්ත්‍රික් විගණනය | 06.02.2013 |
| මොණරාගල දිස්ත්‍රික් විගණනය | 06.02.2013 |
| නියාගම දිස්ත්‍රික් විගණනය | 06.02.2013 |
| මුදල් අංශය විගණනය | 13.02.2013 |

(ආ)

(i ) කාර්යාල හා සාප්පු සේවක පනත අනුව මෙම ගෙවීම් ගණනය කර ඇත.

(ii) පිළිගනිමි. මේ සම්බන්ධයෙන් 2014 වර්ෂයේ අවශ්‍ය කටයුතු කිරීමට චක්‍රලේඛයක් නිකුත් කිරීමට කටයුතු කරන ලදි.

(ඇ)

(i) පිළිගනිමි. 2013 වර්ෂයේ සිට මෙය නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ii) මෙය වර්ෂ කිහිපයකට පෙර පැවති ශේෂ වන බැවින් එය සනාථ කර ගත නොහැක

(ඈ)

(i) ඉදිරියේදී මෙම 10 % රඳවා ගැනීම් බදු අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කිරීමට කටයුතු කරනු ඇත.

(ii) පිළිගනිමි. ඉදිරියේදී මෙවැනි වියදම් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි.

(iii) පිළිගනිමි. දිවයින පුරා මධ්‍යස්ථාන 253 ක ව්‍යාප්තව පවතින මෙම අධිකාරියේ කාර්ය මණ්ඩලයෙහි නිවාඩු වාර්තා අදාල මාසය අවසන් වීමෙන් එළඹෙන ඊලග මාසයේදීම ගෙන්වා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගන්නා අතර, ඇතිවන යම් යම් ප්‍රායෝගික අපහසුතාවයන් මත අතිරේක කාල සීමාවන් ගත වන අවස්ථා ඇත. එසේ වුවත් 2013 වර්ෂයේ සිට අදාල අය කිරීම් වර්ෂය තුළදීම සිදු කර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත.

(ඉ)

(i) අධිකාරියේ මාණ්ඩලික නිලධාරියෙකු ද ඇතුළු කමිටුවක් මගින් වාහනවල ඉන්ධන දැවීම පරීක්ෂා කොට අවශ්‍ය ප්‍රමිතීන් පිහිටුවා ඇත. වාහනවල ඉන්ධන පරිභෝජනය පිළිබඳව වූ තුලනය කිරීම් මෙකී ප්‍රමිතීන් වලට අනුකූලව සිදු කෙරේ

(ii) පිළිගනිමි. අදාළ ආකෘතිය මගින් අතිකාල දීමනා ඉල්ලීම සඳහා අවශ්‍ය උපදෙස් දී ඇත.

(ඊ)

( i) 2012 වාර්ෂික වාර්තාවේ කාර්යය සාධන කොටස මේ වන විට සකස් කර අවසන් කර ඇති අතර එහි පිටපතක් විගණනය සඳහා ඔබ වෙත යොමු කරමි. මුදල් පනතේ 14.2 සී වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විසින් ඉදිරිපත් කරන වාර්තාව භාෂාත්‍රයෙන්ම ලැබී නොමැති බැවින් සම්පූර්ණ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නැත.

(ii) පිළිගනිමි. 2011 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇත.

(iii) 2012 වර්ෂයේ අතිරික්ත මුදල් ආයෝජනය කර නොමැත.

(iv) පිළිගනිමි. හදිසි සේවා අවශ්‍යතා මත මෙම වැඩබැලීමේ පත්වීම සිදුකර ඇත. එසේ වුවද නව ප්‍රතිව්‍යුහගත කරන යෝජනා ක්‍රියාත්මක වීමෙන් පසුව සියළුම පුරප්පාඩු තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කෙරේ. මෙම වැඩබැලීමේ පත්වීම් 44 සිට මේ වන විට 18 දක්වා අඩු වී ඇත.

(උ) (i) පිළිගනිමි. පුහුණු කටයුතු සඳහා ආධුනිකයන් අධිකාරියේ එක් එක් අංශ වලට අනුයුක්ත කිරීම පිළිබඳව ප්‍රමාණයන් තීරණය කොට ඇත්තේ 2007 වර්ෂයේදීය. නමුත් මේ වන විට අධිකාරියේ කාර්යය කටයුතු අතිශයින්ම පුළුල් වී ඇති බැවින් 2007 වසරේදී අනුමත සංඛ්‍යාවන්ට වඩා වැඩි සංඛ්‍යාවක් බඳවා ගැනීමට සිදුවී ඇත. මේ පිළිබඳව පූර්ණ සමාලෝචනයක් සිදුකොට අධිකාරියේ ඒ ඒ අංශ වලට අවශ්‍ය ආධුනිකයන් සංඛ්‍යාව තීරණය කිරීමට කටයුතු කෙරේ.

3.1 එකඟ වෙමි.

3.2 මේ වන විට අධිකාරියට විරුද්ධව පවරා ඇති නඩු සංඛ්‍යාව 09 කි. එම නඩු වලින් නඩු 02ක් පැමිණිලි පාර්ශව විසින් ඉල්ලා අස්කර ගෙන ඇත. නඩු 01ක් සමථයකට පත් වී ඇති අතර ඉතිරි නඩු 06 සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. (අදාළ වාර්තාව ඇමුණුම 04 හි දැක්වේ)

3.3

3.4

වර්ෂය තුළදී සිදුකරන ලද වියදම් එම වර්ෂය තුළදී භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන මත තීරණය වන බැවින් එම වියදම් පසුගිය වර්ෂය හා සැසදීම ප්‍රායෝගික නොවේ.

4.1 <u>කාර්ය සාධනය</u>

(අ) ආධුනිකයන් බදවා ගැනීම ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා 2.57 % කින් වැඩිපුර බඳවා ගෙන ඇත. එසේ සිදුකරනු ලබන්නේ පාඨමාලා හැරයාමේ ස්වභාවය මත ඉලක්කගත ප්‍රමාණය පුහුණු කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට ගලපා ගැනීම පිණිසය.

(ආ) සහතික ලබා දීම් සිදුකරනු ලබන්නේ අදාල වර්ෂය වනවිට වැඩිදුර පුහුණුව අවසන් කර ඇති ආධුනිකයන්ට වන අතර ඔවුන් අවසන් පරීක්ෂණය සමත් වී ඇත්නම් පමණි. වැඩිදුර පුහුණුව සඳහා යොමු කිරීමෙන් අනතුරුව අදාළ කාල සීමාව තුළ රැකියා ලැබීම නිසා අවසන් ඇගයීම සඳහා පැමිණෙන ආධුනිකයින් සංඛ්‍යාව අඩුවී ඇත. ඊට අමතරව පාඨමාලා ප්‍රතීතනය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා බලාපොරොත්තු වූ ප්‍රතිපාදන ප්‍රමාණයට අඩුවෙන් ප්‍රතිපාදන ලැබීම නිසා අවශ්‍ය උපකරණ ප්‍රමාණය ලබාදීමට නොහැකි විය. ඒ අනුව පාඨමාලා ප්‍රතීතනය නොවීම නිසා එම පාඨමාලා වල ඇගයීම් කටයුතු සිදුකිරීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අවසර ලබාදී නොතිබුණි. ඒ අනුව විභාගයෙන් සමත්වී ඇති ප්‍රමාණය 28.58% කින් අඩුවීම සිදුවී ඇත.

(ඇ) 2012 වර්ෂය වන විට පාඨමාලා හැර යාමේ සංඛ්‍යාව 11.23% දක්වා අඩු වී ඇත. මෙය පෙර වර්ෂ හා සැසදීමේදී අවම අගයක් ගෙන ඇත. අදාළ සහකාර අධ්‍යක්ෂවරුන් දැනුවත් කර එය මග හරවා ගැනීමට උපදෙස් ලබා දී ඇති අතර පුහුණුව ගුණාත්මක තත්වයට පත්කිරීම සඳහා පත්කළ කමිටු නිර්දේශ මත මේ පිළිබඳ විධිමත් වැඩ පිළිවෙලක් 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර ඇත.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී රැකියා ගත කිරීම් අඩුවී ඇත්තේ ඉලක්ක ගත ප්‍රමාණයෙන් 21.3% කි. රැකියා ගතවූ ආධුනිකයින් එම ආයතන වල නොරැදීම, පරිසර හා සංස්කෘතික හේතුමත සේවාස්ථාන වලින් ඉවත්වීම, දුර බැහැර ආධුනිකයින් කොළඹ ප්‍රදේශයේ ආයතන වල රැකියා ගත වීමට ඇති අකමැත්ත. පුහුණු ධාරිතාවෙන් වැඩි කොටසක් පරිගණක ක්ෂේත්‍රයේ අය වීම නිසා රැකියා අවස්ථා අඩුවීම. මුස්ලිම් ජාතික ආධුනිකාවන් රැකියා ගත වීමට ඇති අකමැත්ත, රූපලාවන්‍ය ඇඳුම් වැනි ක්ෂේත්‍ර වල ආධුනික පුහුණුව ලැබූ ආධුනිකයින් රැකියා ගත නොවීම, උතුර නැගෙනහිර නිළධාරීන් හිඟය නිසා රැකියා ගතවීම අඩුවීම හා පුහුණුවන්නන් අතර ආරක්ෂක අංශ වල අය පුහුණුවට එකතු වීම නිසා යනාදී කරුණු නිසා රැකියා ගත වීම් අඩුවී ඇත.

(ඉ) 2011 වර්ෂයේද රැකියා ගත වීම් 35%න් අඩුවීමටද ඉහත සඳහන් කරුණු හේතු වී ඇත.

(ඊ) සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ හා සංවර්ධන අංශය සඳහා රු.ලක්ෂ 05ක මුදලක් වෙන් කර තිබූ අතර, ඒ සඳහා පර්යේෂණ 03ක් හා සෙවුම් අධ්‍යයන 5ක් කිරීමට සැලසුම් කර තිබුණි. මෙම වර්ෂයේ අදාළ පර්යේෂණ සිදු කර නොමැති බව හා අදාළ මුදල් වැය කර නොතිබූ බව පිළිගනිමි. ඒ සඳහා වරින් වර සිදුවූ ස්ථාන මාරුවීම්, (දිස්ත්‍රික්ක වල වෙනත් කාර්යයන්හි නිරතව සිටීම) සීමිත ප්‍රතිපාදන තත්ත්වය වැනි හේතු බලපා ඇත. මේ වන විට අදාළ නිලධාරීන් නැවතත් පර්යේෂණ හා සැලසුම් අංශයට අනියුක්ත කිරීමටත්, අවශ්‍ය ප්‍රතිපාදන හැකිතාක් දුරට ලබා දීමටත් ක්‍රියා කර ඇත.

(උ) පෙර ඉගෙනුම් හඳුනා ගැනීම සඳහා (RPL) වැඩ සටහන් සෑම දිස්ත්‍රික්කයටම පැවැත්වෙන අතර, එම වැඩ සටහන් සඳහා සහභාගී වන සුදුසුකම් ඇති කාර්මිකයින් ඒ සඳහා තෝරා ගැනේ. සෑම දිස්ත්‍රික්කයකම වෘත්තීය ක්ෂේත්‍ර තුළ ඉදිරිපත් වන අවම සංඛ්‍යාව මත වැඩසටහන් සිදු කරනු ලබයි. ඒ අනුව මෙහි දක්වා ඇති වැඩසටහන් පවත්වා ඇත්තේ කාර්මිකයන්ගේ ඉල්ලීම් පදනම් කර ගෙනය.

(ඖ)

I දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්ෂේත්‍ර නිළධාරින්ගේ වැඩසටහන් ඒකාබද්ධ කර ඒ යටතේ සිදුකර ඇත. ඒ අනුව ක්ෂේත්‍ර නිළධාරීන් වැඩසටහන් 132 ක් ඉලක්ක කර තිබුණද වැඩසටහන් වර්ග දෙකකට ඒකාබද්ධව 662 පවත්වා ඇත.

II ඇතැම් වැඩසටහන් පැවැත්වීමේදී අපේක්ෂිත සම්පූර්ණ සංඛ්‍යාව අඩුවීමක් දැකිය හැකිය. මෙම වසරේ නිපුණතා බලකායේ කටයුතු නිසා කාර්ය බහුලවීම මෙයට හේතුවිය. නිපුණතා බලකාය මගින් සිසුන් දැනුවත් කිරීම මගින් උතුරු නැගෙනහිර දුෂ්කර ප්‍රදේශවලට යාම වෙනුවෙන් ප්‍රවාහන පහසුකම් සපයා ගත නොහැකි වීම නිසා වැඩසටහන් පැවැත්වීමේ අඩුවක් දක්නට ඇත.

III යොවුන් සේනාංක වැඩසටහන් පැවැත්වීමේදී ඒ මධ්‍යස්ථාන වල පවතින ක්‍රියාකාරකම් අනුව වැඩසටහන් පැවැත්වීමට ඉඩ ප්‍රස්ථා ලබාගැනීමට අපහසුවීම නිසා මෙම වැඩසටහන් පැවැත්වීම අපහසුය. එමෙන්ම විසිර යෑමේ උත්සව හා විවිධ උත්සව අවස්ථා නිසා වැඩසටහන් වලට අදාල ඉඩ ප්‍රස්ථා ලබාගත නොහැකි වීම.

IV පුහුණුවන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද උතුරු නැගෙනහිර ප්‍රදේශ වල අඩු මට්ටමකට සිදුවී ඇති බැවින් එහි සහභාගීත්වය අඩුවක් දක්නට ලැබේ.

V පෙර පුහුණු වැඩසටහන්ද ඉහත සඳහන් පරිදි අඩු ප්‍රමාණයක් පවත්වා ඇති බවක් දක්නට ඇත. මධ්‍යස්ථාන ඒකාබද්ධ කර වැඩසටහන් පැවැත්වීම නිසා වැඩසටහන් ප්‍රමාණයේ අඩුවක් සිදුවී ඇත.

(ඵ) ව්‍යාවසායකත්ව වැඩසටහන් පැවැත්වීම අඩුවී ඇත්තේ සම්පත්දායකයින් සේවා අවශ්‍යතාවය මත වෙනත් රාජකාරි කටයුතුවල යෙදවීමට සිදුවීම හේතුවෙනි. මේ වන විට මෙම තත්ත්වය නිවැරදි කිරීමට ක්‍රියා කර ඇත.

(ඒ) "ඔබේ ව්‍යාපාරය දැනගන්න" වැඩසටහන් වලදී ඉලක්කගත සිසුන් ප්‍රමාණය සහභාගී කරවාගනු ලබන්නේ පාඨමාලාවලට බඳවා ගත් සංඛ්‍යාව අනුවය. ඒ අනුව වැඩසටහන් සැලසුම්ගත ඉලක්ක අඩුවිය හැකි අවස්ථා ඇතිවේ. එමෙන්ම ව්‍යාවසායත්වය සඳහා දැනුම ලබාගැනීමට ඉදිරිපත් වන සිසුන් සංඛ්‍යාව අඩුවීම නිසා එහි සහභාගීත්වය අඩුවී ඇත.

(ඔ) SEPI ණය ලබාදීමේදී වානිජ බැංකුවල පවතින දැඩි නීති හා ඇප සුරැකුම් ලබාදීමට අපහසුවීම නිසා ප්‍රගතිය අඩුවක් දක්නට ඇත. මේ අනුව මෙයට සමාන්තර අනෙක් ණය පහසුකම් පිළිබඳ අවධානය යොමුකර ඇත.

4.2

(අ)

(i ) දිවයින තුළ රැකියා ඉල්ලුම තිබෙන එහෙත් සමාජ ඉල්ලුම නොමැති පාඨමාලා සඳහා රඳවා ගන්නා ප්‍රමාණය එක් පාඨමාලාවකට අවම සීමාව 10 දක්වා සංශෝධනය කිරීමට තීරණය කර ඇත. (උදා :- වඩු කාර්මික, පෙදරේරු, පැස්සුම් ශිල්පී, ජලනළ පාඨමාලා වැනි). මීට අතිරේකව සමාජ ඉල්ලුමක් සහිත පාඨමාලා වල ආධුනික බඳවා ගැනීම් 10 වඩා අඩුවන අවස්ථාවලදී ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි.

(ii) පාඨමාලා වලට ඇතුළත් කර ගන්නා ආධුනිකයින් ප්‍රමාණය 15 ක් වුවත් පාඨමාලා හැරයාමේ ප්‍රවණතාවයක් ඇති බැවින් පසුගිය වර්ෂ වලදී වැඩිපුර බඳවා ගැනීමට කටයුතු කර ඇත.එසේ වූ විට හැරයාමේ ප්‍රතිශතයද ඉහළ අගයක් පෙන්නුම් කෙරේ. එමනිසා ඉදිරියේ පාඨමාලා වලට ඉලක්ක ගත ප්‍රමාණය පමණක් බඳවා ගැනීමට උපදෙස් දී ඇත.

(ආ) ආධුනික ලියාපදිංචි ගාස්තු

බඳවා ගැනීම් අනුව ලියාපදිංචි ගාස්තු නිවැරදිව ගිණුම්වල දක්වා ඇති අතර වෙනත් වාර්තා මගින් ලබා දී ඇති තොරතුරු හා අවසාන ගිණුම් අනුව ලබා දෙන තොරතුරු සැසඳීම් කිරීමට වැඩපිළිවෙලක් යොදා ඇත.

(ඇ) මෙම නිලධාරියාගේ වැඩ තහනම් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සමක් ගොනු කර තිබූ බැවින්, ඔහුගේ වැටුප නතර කිරීම සම්බන්ධයෙන් නෛතික ගැටළු මතුවීමට ඉඩ කඩ ඇති බව එවකට සිටි නීති නිලධාරිනිය විසින් පෙන්වා දීම මත මොහුගේ වැටුප නතර කිරීමට පියවරක් ගැනීමට නොහැකි විය.

නමුත් මෙම අධිකාරියේ නව අධ්‍යක්ෂ මණ්ඩලය පත්වීමෙන් පසුව 2013 මැයි මස සිට ක්‍රියාත්මක වන පරිදි ඔහුගේ වැටුප නතර කරන ලදි. මූලික විමර්ශන වාර්තාව පදනම් කර ගෙන මොහුට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කොට විධිමත් විනයානුකූල පරීක්ෂණයක් පවත්වා එකී පරීක්ෂණ වාර්තාවේ නිර්දේශයන්ට අනුව සේවයෙන් පහ කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව ගෙවන ලද වැටුප් සම්පූර්ණයෙන් ගෙවන ආපසු ගෙවන ලෙස මොහුට දන්වා ඇතත් ගෙවීම ප්‍රතික්ෂේප කර ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ඉල්ලා ඇත.

(ඈ) ඒ අනුව මුල් කාර්තු 02 තුළ කාර්තුවකට රැස්වීම් එක බැගින් පවත්වා ඇත. අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය 2012 සැප්තැම්බර් මස විසුරුවා හැර නැවත නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කලේ 2013 වසරේ සිට බැවින් තුන්වන හා හතරවන කාර්තුවල විගණන හා කළමණාකරණ රැස්වීම් පැවැත්වීමට හැකියාවක් නොතිබුනි.

(ඉ) මෙම විශේෂඥ උපදේශකවරු දෙදෙනාගේ 2012.11.12 දින සිට නතර කර ඇත. මේ සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු 2011 වර්ෂයට අදාළව විගණනයට ඉදිරිපත් කර ඇත.

(ඊ)

I පිළිගනිමි. මෙම පුහුණු වැඩසටහන රාත්‍රී 10.00 වන තෙක් පැවැත්වූ බැවින් ඊට සහභාගී වූවන්ට ආහාර පිටතින් ලබා ගැනීමට නොහැකි වීම මත එවකට සිටි සභාපතිවරයාගේ පූර්ව අනුමැතියට යටත්ව ඔවුන්ට රාත්‍රී ආහාර පාන සැපයීමට කටයුතු කර ඇත. ඉදිරියේදී මෙවැනි තත්වයක් ඇති නොවීමට කටයුතු කර ඇත.

II ශ්‍රී ලංකා ජාතික සමූපකාර මණ්ඩලය රජයට අනුබදධිත ආයතනයක් වන බැවින් එහි නේවාසික පහසුකම් පවතින නිසාත්,මිල ගණන් කැඳවීමකින් තොරව එම ආයතනයේ පුහුණු වැඩසටහන් පවැත්වීමට කටයුතු කර ඇත.

(උ)

(i) මඩකලපුව හා නුවරඑළිය දිස්ත්‍රික්ක වලට ලබාදෙන ලද භාණ්ඩ වෙන වෙනම වට්ටෝරු ගත කොට වට්ටෝරු ලේඛන වල සඳහන් කර ඇත. චන්දාරමූලෙයි මධ්‍යස්ථානය ලබා දී තිබූ භාණ්ඩ නැතිවීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය.

(ii) ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේ පැවැති අඩුපාඩුකම් මත ආධුනික සංඛ්‍යාව අඩුවී ඇති නමුත් පුහුණු උපකරණ ලැබීම සහ පුළුල් වැඩපිළිවෙල මත මෙම තත්ත්වය නිවැරදි කර ඇත. මීට අමතරව CNC (Computer Numerical Control) පාඨමාලාවට බඳවා ගැනීම සඳහා සුදුසුකම ලෙස යන්ත්‍රකරු මට්ටම 3 සමත්වී තිබිය යුතුය. එහෙත් එම ප්‍රදේශයේ ඉහත සුදුසුකම් සහිත ඉල්ලුම්කරුවන් සංඛ්‍යාව අඩුවීමද මෙයට බලපා ඇත.

(iii) මෙම නිලධාරියා ඉල්ලා අස්වීමේදී අධිකාරිය සමග ඇතිකරගත් ගිවිසුම අනුව අදාළ මුදල අයකර නොගැනීමට හේතු වූයේ ඔහු රේඛීය අමාත්‍යාංශ යටතේම පැවැති ආයතනයක් වන කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරිමේ දෙපාර්තමේන්තුවේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත්ව යාම හේතුවෙනි. එකී ගිවිසුම අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත අදාළ දෙපාර්තමේන්තුව වෙත පැවරීමට කටයුතු කර ඇත.

(ඌ)

I. සැපයුම්කරුවන් විසින් සාම්පල ඉදිරිපත් නොකිරීම නිසා ඇණවුමට අදාල බොහෝමයක් උපකරණ සඳහා තාක්ෂණික වාර්තා ලබා දීමේදී සැපයුම්කරු දී ඇති විස්තර පත්‍රිකා පරීක්ෂා කර දීර්ඝ අධ්‍යනයකින් අනතුරුව තාක්ෂණික වාර්තා ලබා දී ඇති නිසා සැලකිය යුතු කාල ප්‍රමාදයක් සිදු වී ඇත. මීට අමතරව තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයන් දිස්ත්‍රික් මධ්‍යස්ථාන වල ඉගැන්වීම් කටයුතු හා පරිපාලන කටයුතු වල නියැලෙන නිලධාරීන් වන බැවින්, අදාල රාජකාරී කරන අතර එයට බාධාවක් නොවන පරිදි කටයුතු කිරීම නිසා යම් කාල ප්‍රමාදයක් වූ බව පිළිගනිමි ඉදිරියේදී මේ තත්වය නිවරදි කිරීම සඳහා කටයුතු කරනු ලබන අතර ඉදිරියේදී මෙවන් තත්වයක් ඇති නොවීමට සටහන් කර ගතිමි.

II. මෙම උපකරණ පාඨමාලා වැඩි දියුණු කිරීම සඳහා මිල දී ගනු ලැබූ උපකරණ වූ අතර බොහොමයක් උපකරණ වෙළඳපොලේ සුලභ උපකරණ නොවේ. එය පුහුණුවට අදාල ලෙස සැකසිය යුතු අතර පුහුණුව සඳහාම පමණක් භාවිතා කරයි. තවද නිෂ්පාදනය සඳහාද යම් කාලයක් ගත වේ.

මෙම උපකරණ විදේශ වලින් ආනයනය කරන අතර මෙතරම් කාල පමාවක් සිදු වූයේ එබැවිනි. එබැවින් පුහුණුවන්නට යම් ප්‍රමාදයන් සිදු වුවද පාඨමාලා අවසන් වීමට ප්‍රථම සමහර උපකරණ ලැබීම නිසා මේ තත්වය අවම කර ගැනීමට හැකිවිය.

III. ඇණවුම් අංක 18ට අදාලව සැපයුම්කරු විසින් සපයා ඇති ඇණවුම් වටිනාකමින් 44.5% යුත් උපකරණ ගබඩාවට භාර ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබූ අතර (එය පිටු අංක 851) අනතුරුව සපයා තිබූ අයිතම 07ක් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. මේ සම්බන්ධයෙන් ටෙන්ඩර් මණ්ඩලය දැනුවත් කර තිබූ අතර 2013/07/25 දින ටෙන්ඩර් මණ්ඩලය තීරණය කර තිබුණේ (පිටු අංක 857-858) 2012/09/15 දින දක්වා බැංකු ඇපකරය දිර්ඝ කරන ලෙස හා ගෙවන ලද අත්තිකාරම් මුදල් අඩු කරගෙන සපයා ඇති වටිනාකමින් 5% රඳවා ගැනීමෙන් අනතුරුව ඉතිරි මුදල් ගෙවන ලෙසයි. ඒ අනුව අදාල ආයතනය විසින් 2012/10/15 දින දක්වා බැංකු ඇපකරය දීර්ඝ කර තිබුණි. ( පිටු අංක 863)

IV. මිලියන 6,840,673ක් වූ වටිනාකමකින් යුත් සහිත උපකරණ සපයා අවසන් ඇගයීම් වාර්තා ලබා දී තිබුණේ 2012.10.03 දිනය. වටිනාකම රු. මිලියන 6,090,768.00ක් වූ උපකරණ සපයා තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අදාල උපකරණ නිෂ්පාදිත රට පිළිබඳව ඇති වූ ගැටළුවක් මත ප්‍රතික්ෂේප කර තිබූ අතර එම උපකරණ නැවත සපයා නොමැත.

V. අදාළ උපකරණ පුහුණුව සඳහා වන අවශ්‍යතාවය නැවත ටෙන්ඩර් කමිටුව සාකච්ඡා කළ අතර, ටෙන්ඩර් කමිටුවේ තීරණය වූයේ ගන්නා ලද තීරණය නිෂ්ක්‍රීය කොට නැවත ටෙන්ඩරය යාවත්කාලීන කරන ලෙසයි. ඒ අනුව අදාළ තීරණය ටෙන්ඩර් මණ්ඩල සභාපති ලෙස සැපයුම් කළමණාකරුට දැන් වූ අතර, අදාළ ටෙන්ඩර් මණ්ඩල අත්සන් සහිත තීරණයද මේ සමඟ අමුණා ඇත. මෙම එන්ජිම සම්බන්ධයෙන් උපදේශකවරුන් දැනුවත් කර නොතිබූ අතර ඒ අනුව යම් යම් ගැටළු මතුවිය. පසුව උපදේශකවරුන් ගෙන්වා අදාල එන්ජිම සම්බන්ධයෙන් වැඩමුළුවක් පවත්වා මේ සම්බන්ධ පුළුල් අවබෝධයක් ලබා දී ඇති අතර අදාල මව් සමාගම විසින් එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධ D.V.D. තැටිද ලබා දී ඇති අතර ගැටළුවකින් තොරව පුහුණුව ක්‍රමවත්ව කරගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. මෙම ඇණවුමට අදාල අයිතම 19න් අයිතම වර්ග 03ක් සැපයුම්කරු විසින් සපයා තිබූ අතර මෙය මුළු ඇණවුම් වටිනාකමින් 83.32%කි.

VI. ඇණවුම් 66ට අදාල අයිතම 16ක් සැපයුම්කරු විසින් සපයා නොතිබිණි.

VII. පිළිගනිමි. මෙම උපකරණ සපයන ආයතන සීමිත ප්‍රමාණයක් තිබීම නිසා හා ටෙන්ඩර් සඳහා ඉදිරිපත් වන ප්‍රමාණයද සැලකිල්ලට ගෙන අසාදුගත ලේඛනයට මෙම ආයතනය ඇතුලත් කර නැත.

(එ)

i. එම කාර්යය අවිනිශ්චිත වියදම් සීමාව 10% ඉක්මවා තිබූ බැවින් එවකට සිටි සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. ඊට අදාල අනුමැතිය අප වෙත නොලැබුණ බැවින් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර නොමැති අතර අමාත්‍යාංශ තීරණය මත ඉදිරියේදී ගිණුම්වල ගැලපීමට කටයුතු කරනු ලැබේ.

ii. මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2012.12.31 දිනට අවසන් කර තිබුණද ඉදිකිරීම් ඒකකය මගින් පරීක්ෂා කොට නිර්දේශ ලබා දී ගෙවීම් කිරිම සඳහා කාලයක් ගත වූ බැවින් 2012 වසරේ තවදුරටත් ඉදිරියට කෙරී ගෙන යන වැඩ වශයෙන් 2013 වර්ෂයේදී අදාල වටිනාකම ගොඩනැගිලි ගිණුමට මාරු කිරීමට කටයුතු කර ඇත.

iii. මෙම ප්‍රමාද වූ ව්‍යාපෘති වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ප්‍රමාද ගාස්තු සහ කාර්යය සාධන බැඳුම්කර දීර්ඝ නොවීම හේතුවෙන් ඊට සමාන මුදල් ප්‍රමාණයන්ද අය කර ගැනීමට කටයුතු කර ඇත.

iv. ගිවිසුම්ගත කාලය තුල අවසන් කිරීමට නොහැකිවූ එහෙත් සාධාරණ හේතු දක්වා තිබූ ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන මණ්ඩලයෙන් කාල දිගුවක් ලබා දී ඇති අතර එසේ සාධාරණ හේතූන් නොදක්වා ඇති ප්‍රමාදයන් වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාර ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර ඇත.

(ඒ)

(I.) අවසන් ඇගයීම් වාර්තාවල පැවති යම්යම් අඩුපාඩු සහ සැපයුම්කරුවන් විසින් ඇණවුමට අදාල උපකරණ සැපයීම සම්පූර්ණ නොකිරීම හා සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කර තිබූ ඉන්වොයිස් වල අඩුපාඩු හේතුවෙන් මෙම ගෙවීම් සිදු කිරීමට ප්‍රමාද වී ඇත. ඉහත සඳහන් කරන ලද අඩු පාඩු නිවරදි කර ගනිමින් ගෙවීම් කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් පවති. මේ වන විටත් මෙම ගෙවීම් වලින් කිහිපයක් ගෙවා අවසන්ව ඇත. ඉතිරි ගෙවීම් ද ඉදිරියේදී ගෙවා අවසන් කිරීමට කටයුතු කරමි.

(II.) මෙම භාණ්ඩ වලට අදාල අවසන් තාක්ෂණික ඇගයීම් වාර්තා අස්ථාන ගත වී තිබීම හා ඉන්වොයිස් වල තිබූ අඩුපාඩු හේතුවෙන් මෙම ගෙවීම් සිදු කිරීම ප්‍රමාද විය. අදාල භාණ්ඩ නිකුත් කර තිබූ ප්‍රාදේශිය මධ්‍යස්ථාන වලින් එම උපකරණ භාවිතා කරන උපදේශක මහතුන්ගෙන් අදාල උපකරණ පිළිබඳ වාර්තාවක් ලබා ගෙන 2013 වර්ෂයේ දී ගෙවීම් කරන ලදි.

(III.) ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඔ) වැටුප් අංක 809 හිමි යූ.ජී.එස්.සී. කාරියවසම් මහත්මිය 2012.06.01 දින සිට 2012.12.01 දින දක්වා මාස 06ක කාලයක් පෞද්ගලික හේතුවක් මත ඕස්ට්‍රේලියාවට යාමට වැටුප් රහිත විදේශ නිවාඩු අයදුම් කරන ලදි. ඒ අනුව ඇය වැටුප් රහිත විදේශ නිවාඩු කාලය මෙන් දෙගුණයක (වසර 01) සේවා ගිවිසුමකට අත්සන් කරන ලදි.

එහෙත් අමාත්‍යාංශයෙන් මෙම නිලධාරිනියට මාස 03 කාලයක් පමණක් වැටුප් රහිත විදේශ නිවාඩු අනුමත කරන ලදි. ඇය වැටුප් රහිත විදේශ නිවාඩු අවසාන වූ දින සිට එනම්, 2012.08.31 දින සිට සේවයෙන් ඉල්ලා අස් විය.

විදේශ නිවාඩු ලබා ගැනීමේදී ඇය මාස 06ක විදේශ නිවාඩු ලබා ගැනීම සඳහා වසර 01ක අනිවාර්ය සේවා කාලයකට ගිවිසුම අත්සන් කලද, ඇයට මාස 03ක කාලයක් විදේශ නිවාඩු අනුමත වූ බැවින්, අනිවාර්යය සේවා කාලය මාස 06ක් (වැටුප් රහිත විදේශ නිවාඩු කාලය මාස 03 × 02) ලෙස සලකා වසරක අනිවාර්යය සේවා කාලයකට අත්සන් කරන ලද ගිවිසුමින් භාගයක මුදලක් ඇයගෙන් අයකර ගන්නා ලදි.

(ඕ) ගබඩාවේ ඌනතා අතිරික්ත පිළිබඳව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ වාර්තාව අනුව හෙළිදරව් වී ඇති ඌණතා වටිනාකම රු.1,593,015,27 කි. ඊට ආයතනික ගාස්තු 25% එකතු වූ විට අයකර ගත යුතු මුළු මුදල රු.1,981,177.83 කි. මෙම ඌණතාවය සම්බන්ධයෙන් අදාළ නිලධාරියා විරුද්ධව විනයානුකූල කටයුතු සිදු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ක) අනුරාධපුර දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ නිලධාරීන්ට සංයුක්ත දීමනා ගෙවා නොමැති අතර, ප්‍රදර්ශන රාජකාරී වෙනුවෙන් ගෙවනු ලබන විශේෂ දීමනා වශයෙන් රු. 424.500 ගෙවා ඇත.

(ග) මෙම සියළුම අර්ධකාලීන පාඨමාලා සඳහා සකස් කර ඇති ඇස්තමේන්තු අනුව අවම ආධුනික සංඛ්‍යාවක් නැතත් පාඨමාලා ආරම්භ කෙරේ. එම පාඨමාලා වලට ආධුනිකයන් බඳවා ගැනීම ප්‍රචලිත කිරීම සඳහා ගාස්තු ගෙවීම වාරික 2 කින් සිදුකෙරේ. සමහර අවස්ථාවලදී පළමු වාරිකය ගෙවා පසුව පාඨමාලා හැරගිය ආධුනිකයින් සිටී. එසේ දෙවන වාරිකයක් අයකර ගැනීමට හැකියාවක් නැත. කෙසේ වෙතත් මෙම පාඨමාලා වලට අදාළ උපදේශක ගෙවීම් කිරීමේදී අධිකාරියට පාඩුවක් නොවන ලෙස ඇස්තමේන්තු නැවත සංශෝධනය කර අදාළ උපදේශක ගෙවීම් සිදුකර ඇත.

(ජ) 2011 වර්ෂයේ හය මාසික පාඨමාලා වල පළමු කණ්ඩායම් සඳහා ඇගයීම් කරනු ලබන්නේ 2012 ජනවාරි මාසයෙන් පසුව වන අතර 2011 වසරේ පාඨමාලා සහ 2011 දෙවන කණ්ඩායමේ හය මාසික පාඨමාලා සඳහා ඇගයීම කරනු ලබන්නේ 2012 ජූනි මාසයෙන් පසුවය. මේ වන විට සහතික පත්‍ර වැඩි ප්‍රමාණයක් නිකුත් කර ඇති අතර පාඨමාලා ප්‍රතීතන ගැටළු නිසා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත යවා ඇති ප්‍රතිඵල වලට අදාළ සහතික නිකුත් කිරීමේ කටයුතු කරමින් පවතී.

(ත) පාඨමාලා ප්‍රතීතනය කිරීම සඳහා ඉකුත් වර්ෂ වලදී තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ආධාර වශයෙන් ලබා දී තිබූ ප්‍රතිපාදන මගින් එම උපකරණ ගැනීමට සැපයුම් අංශය වෙත යොමුකර ඇත.

4.3

(අ) මෙම කාර්යය සිදු කළ 2009 වර්ෂයේදී මුළු කාර්යය සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති අතර මේ සඳහා ගෙවීම් සිදුනොකරන ලද බැවින් 2013 වර්ෂයේදී මෙය ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර ඇත.

(ආ) පාරිතෝෂික ගෙවීම් පනත අනුව සේවකයෙකුට පාරිතෝෂික මුදල් සේවය අවසන් කල දින සිට දින 30ක් ඇතුලත ගෙවිය යුතු නමුත්, කිසියම් සේවකයෙකුගේ සේවය අවසන් කිරීමේදී ඔහු භාරයේ ඇති අධිකාරියට අයත් භාණ්ඩ හා ලිපි ලේඛණ නිවැරදිව ඔහු විසින් භාර දෙන තෙක් අදාල ගෙවීම් කිරීම ගැටළුවකි.

විශේෂයෙන්ම අධිකාරියේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් උපදේශකවරු වැනි නිලධාරීන් භාරයේ පුහුණු ද්‍රව්‍ය හා පුහුණු උපකරණ ආදිය ඇති බැවින් ඒවා නිසි පරිදි භාර දෙන තෙක් ඔවුන්ට අදාල දීමනා ගෙවීම ප්‍රමාද කිරීමට සිදුවී ඇත. එසේම බොහෝ නිලධාරීන් සේවය කරනු ලබන්නේ දිවයිනේ විවිධ ප්‍රදේශ වල පිහිටුවා ඇති දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන සහ ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථාන ආදියෙහිය. එවැනි නිලධාරීන් සම්බන්ධයෙන් අයවීම් විස්තර ගෙන්වා ගැනීමට ප්‍රමාදයන් සිදුවේ. එබැවින්, ප්‍රායෝගිකව පැන නගින ගැටළු මත දින 30ක් ඇතුලත අදාල ගෙවීම් කිරීමට හැකි නොවන අවස්ථා පැන නගින යම් යම් නොවැළැක්විය හැකි හේතූන් මත නියමිත කාලය තුල අදාල ගෙවීම් කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගනු ලැබේ. කෙසේ වුවද, පාරිතෝෂික ගෙවීම් කිරීමේදී කිසියම් ප්‍රමාදයක් සිදුවන අවස්ථාවලදී එසේ ප්‍රමාද වීමට හේතුව පිළිබඳ අදාල සේවකයා දැනුවත් කිරීමට කටයුතු කරනු ඇත.

(ඇ) රුපියල් හතලිස් දහසක අත්තිකාරමක් ලබා ගෙන ඇත්තේ උප සභාපතිතුමාගේ ආහාර හා නවාතැන් පහසුකම් සඳහා වන අතර රුපියල් හතලිස් හතරදහසක් ගෙවා ඇත්තේ දැයට කිරුළ ප්‍රදර්ශනයට සහභාගී වූ නිලධාරීන්ට නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙනි.

4.4

(අ) 2013 වර්ෂයේදී අක්‍රීයව පවතින ගිණුම් සියල්ල වසා දැමීමට කටයුතු කරන ලදි.

(ආ) මේ වන විට අදාළ භාණ්ඩ වලින් විශාල ප්‍රමාණයක් නිකුත් කර ඇත. අවශ්‍යතා හඳුනා ගැනීමෙන් පසුව ඉතිරි භාණ්ඩද නිකුත් කිරීමට කටයුතු කරමි.

4.5 ඉදිරියේදී ප්‍රසංග සඳහා අනුග්‍රහය හා අනුග්‍රාහක බැනර් සඳහා අනුග්‍රහය ලබා නොදීමට කටයුතු කරනු ඇත.

4.6

(අ) මෙම නිලධාරීන් නියමිත වැටුප් තල වල පිහිටුවීමට කටයුතු කරන ලදි.

(ආ) පිළිගනිමි.

(ඇ) අන්තර්ජාල පහසුකම් සඳහා ලබාදී තිබූ පරිගණක මෘදුකාංගය විසන්ධි කර ඇත.

(ඈ) පිළිගනිමි,මීට අදාළ නිලධාරියා සම්බන්ධව විනය ක්‍රියාමාර්ගයන් අනුගමනය කර ඇත.

4.7 (අ) මෙම කොන්ත්‍රාත්තුව “Design and Build” ප්‍රසම්පාදන ක්‍රමය යටතේ සිදුවූවකි. එම ප්‍රසම්පාදන ක්‍රමය තෝරා ගන්නා ලද්දේ එවැනි නිර්මාණයක් කිරීමටත් එවැනි ඇස්තමේන්තුවක් සකස් කිරීමටත් අධිකාරිය සතුව කාර්යය මණ්ඩලය නොවන බැවිනි. මෙම කාර්යය සඳහා ජාතික ප්‍රසම්පාදන ක්‍රමය යටතේ ප්‍රසිද්ධ පුවත්පත්වල දැන්වීම් පලකර ලංසු ලබා ගැනීමට කටයුතු කරන ලදි. ඒ අනුව එක් ලංසුවක් පමණක් මේ සඳහා ලැබී තිබුණි.

(ආ) මෙම කොන්ත්‍රාත්තුව සඳහා මිල විචලනයන් ගෙවා නොමැත. නමුත් ඇතැම් අයිතමයන්හි ඇතිවූ ප්‍රමාණයන් ඉක්මවීම හා ඇතැම් ආදේශන සඳහා අමතර කාර්යයන් වෙනුවෙන් ගෙවීම් සිදු කර ඇත.

(ඇ) මෙම කාර්යය සිදු කරගෙන යාමේදී විටින් විට මෙම නිර්මාණයේ ඵලදායීතාව පදනම් කරගෙන සිදු කළ වෙනස් කිරීම් සහ එකතු කිරීම් නිසාත් ඇතැම් අමු ද්‍රව්‍ය ඇතිවූ දේශීය සුලභතාවය හේතුවෙනුත් මෙම කාර්යට සැලසුම් කළ කාලයට වඩා වැඩි කාලයක් ගත විය.

(ඈ) මෙම ගොඩනැගිල්ල පැරණි බාහිර පෙනුමක් සහිත වූ ගොඩනැගිල්ලක් වූ බැවින් ආධුනික ආකර්ෂණය හා ආයතනයේ පෞරුෂත්වය පවත්වා ගැනීමේ තත්ත්වයන් යටතේ සිදු කිරීමට හැකි වූ කෙටිම ක්‍රමය මෙසේ බාහිර ආවරණ හා ආලෝකකරණය කිරීමයි. මේ තුළින් ජාතික වෘත්තීය පුහුණු ආයතනය කොළඹ නගරයේ භූමි සළකුණු ගොඩනැගිල්ලක් බවට පත් වී ඇති අතර ඒ තුළින් වෙනදාට වඩා සමාජීය ආකර්ශණයක් ආයතනයට ලැබී ඇත.

4.8 (අ) විගණන විමසුම මගින් මෙම අධිකාරියේ නිලධාරීන් 25 දෙනෙකු දීර්ඝ කාලීනව බාහිර ආයතන වලට මුදාහැර ඇති බව දක්වා ඇත. නමුත් මේ වන විට අදාළ නිලධාරීන් 25 දෙනා අතුරින් රේඛීය අමාත්‍යාංශය ඇතුළුව බාහිර ආයතන වල සේවය සඳහා මුදාහැර ඇති නිලධාරීන් සංඛ්‍යාව 13 ක් පමණි. අදාල විස්තර පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 1) | අධිකාරියේ සේවයෙන් ඉවත්ව ඇති නිලධාරීන් සංඛ්‍යාව | 07 |
| 2) | නැවත අධිකාරියේ සේවයට වාර්තා කළ නිලධාරීන් සංඛ්‍යාව | 05 |
| 3) | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව සිටින නිලධාරීන් සංඛ්‍යාව | 08 |
| 4) | බාහිර ආයතන වලට මුදාහැර ඇති නිලධාරීන් සංඛ්‍යාව | 05 |
| | | 25 |

ඉහත සඳහන් පරිදි රේඛීය අමාත්‍යාංශය සහ ජනාධිපති කාර්යාලය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව යන ස්ථාන වලට නිලධාරීන් අනුයුක්ත කර ඇත්තේ සේවා අවශ්‍යතාවය අනුවය. පසුගිය කාලය තුළ එකී නිලධාරීන්ගේ සේවය අදාළ ආයතන වලට තවදුරටත් අවශ්‍ය වූ හෙයින් ඔවුන් අධිකාරියට නැවත ගෙන්වා ගැනීමට නොහැකි විය.

(ආ) මේ වන විට යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරනු ලබන්නේ උපදේශකවරු 04 දෙනෙකු පමණි. එකී උපදේශකවරු අමාත්‍යාංශයට අනුයුක්ත කර ඇත්තේ තාක්ෂණික පාඨමාලා සැලසුම් කිරීමේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට අදාළව අවශ්‍ය සහය ලබාදීම සඳහාය.ඒ අනුව ඔවුන්ගේ පත්වීම් ලිපිවල සඳහන් කොන්දේසි වලට අනනුකූලතාවයක් ඇති නොවේ.

(ඇ) මෙම නිලධාරිනියගේ නිත්‍ය තනතුරේ වැටුප හා දීමනා ලෙස රු.40,865.00 ක මුදලකට ඇයට හිමිකම් පවතී. ළමා හා කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස 2012.07.17 දින සිට පත්කර ඇති මෙම නිලධාරිනිය වැටුප් ප්‍රතිපූර්ණය කිරීමට යටත්ව එම අමාත්‍යාංශයෙන් නිදහස් කර තිබුණි. එම නිලධාරිනිය ඇයගේ නිත්‍ය තනතුරේ සේවයේ යෙදී සිටියා නම් ඇයට රු.40,865.00 ක වැටුපක් ගෙවිය යුතු වන අතර, අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් තනතුරට වෙනත් අයෙකු පත් වන අතර, ඊට නියමිත වැටුපත් ඔහුට හෝ ඇයට ගෙවීමට රජයට සිදුවේ. එබැවින් සමස්තයක් ලෙස සැලකීමේදී මෙමගින් රජයට මූල්‍යමය වාසියක් අත් පත් වී ඇති බැවින් ප්‍රතිපූර්ණය නොවූ රු.99,167.50 ක මුදල ඇයගෙන් අයකර ගැනීම සාධාරණ නොවන බැවින් එම මුදල් අය කර නොගැනීමට කටයුතු කර ඇත. එබැවින් රජයට අලාභයක් සිදුවී නොමැති බවද සඳහන් කරමි.

(ඇ) සේවක අංක 294 හිමි ජී.එම්.පී.ඒ. ගල්ලබ මහතා 2012/03/01 දින සිට අධිකාරියේ සේවයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත.මේ වන විට එකී ඉල්ලා අස්වීම පිළිගෙන ඇත. ඔහුගේ පාරිතෝෂික මුදල් ගෙවීමට කටයුතු කර ඇත. මෙම වාහන අනතුර සම්බන්ධයෙන් වන පූර්ව කමිටු වාර්තාවේ පවත්නා දෝෂ සහගත තත්ත්වයන් මත සියළුම කරුණු නිරික්ෂණය කිරීම සඳහා වර්තමාන උප සභාපතිගේ ප්‍රධානත්වයෙන් නැවතත් කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර උපදෙස් ලබා ගැනීමට වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත. ඒ අනුව වගකිව යුතු පාර්ශවයන් ගෙන් අයකිරීම පිළිබඳව තීරණය කරනු ලැබේ.

(ඉ) මෙම නිලධාරීන් දෙදෙනාම අදාල තනතුරු වලට පත්කර ඇත්තේ කොන්ත්‍රාත් පදනම මත වන අතර පහත සඳහන් පරිදි ඔවුන්ගේ කොන්ත්‍රාත් සේවා කාලය අවසන් වී ඇති අතර එම දිනයන් ගෙන් පසුව සේවය දීර්ඝ කර නැත.

| නම | | කොන්ත්‍රාත් සේවය අවසන් කළ දිනය |
|---|---|---|
| ඩී.එම්.ආර්.සී.ඒ.කේ.බණ්ඩාර මහතා | - | 2012.10.31 |
| ආර්.එම්.එන්.ඩී.රාජගුරු මහතා | - | 2012.12.31 |

(ඊ) KI – 2563 - රාජකාරී අවශ්‍යතාවය මත අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත.

KI – 2565 - මෙම රථය ආපසු අධිකාරිය වෙත ලබාදී ඇත.

PA –1227 - මෙම කැබ් රථය දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් පරිහරණය කරන අතර නැවත භාරදෙන ලෙස දන්වා යවා ඇත. නමුත් ඊට ප්‍රතිචාර දක්වා නැත.

4.9

(අ) සේවා අවශ්‍යතා මත මෙම බඳවා ගැනීම් සිදු කර ඇත.නමුත් මේ වන විට ආයතනයේ ප්‍රතිව්‍යුහගත කරන ක්‍රියාවලියට අදාළව කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. සියළුම තනතුරු සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටි සකස් කොට අනුමැතිය සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇත.

(ආ) මෙම නිලධාරියාට නැවත අධිකාරියේ සේවය සඳහා පැමිණෙන ලෙස දන්වා ඇත. මේ වන විට අදාළ තනතුරේ වැඩ බැලීම සඳහා නිලධාරියෙක් පත් කර ඇත.

(ඇ) මෙම තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

(ඈ) අමප/11/1203/539/021 සහ 2012.12.20 අංක දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මත මෙම අධිකාරියේ කාර්ය මණ්ඩලය අධ්‍යයන හා අනධ්‍යාන වශයෙන් කොටස් දෙකකට වර්ග කරන ලද අතර ඒ සඳහා කළමණාකරණ අධ්‍යක්ෂ ජනරාල්ගේ DMS/1680 සහ 2013.12.17 දින දරණ ලිපිය මගින් අනුමැතිය දී ඇත. ඒ අනුව අධ්‍යාන කාර්ය මණ්ඩලයට අයත් වන නිලධාරීන් තම නිත්‍ය තනතුරේ රාජකාරී කටයුතු වලට අනුයුක්ත කිරීමට කටයුතු කරනු ලැබේ. ඊට අමතරව දිස්ත්‍රික් හා පුහුණු මධ්‍යස්ථාන වල සේවය කරන අනධ්‍යාන කාර්ය මණ්ඩලය හඳුනාගෙන ඔවුන් වෙනත් දිස්ත්‍රික්ක වලට අනුයුක්ත කිරීමට කමිටුවක් පත් කර ඇති අතර එම කමිටු නිර්දේශ මත ඉදිරි කටයුතු කරනු ඇ

(ඉ) අදාළ නිලධාරීන් යොදවා ඇත්තේ පාඨමාලා පවත්වා ගෙන යෑමට අදාළව අත්‍යාවශ්‍ය රාජකාරී වෙනුවෙනි. පාඨමාලා පවත්වා ගෙන යෑමේදී එකී පාඨමාලා NVQ මට්ටමිනි පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය ප්‍රතීතනය සම්බන්ධයෙන් මග පෙන්වීම් හා අධීක්ෂණය කිරීම සඳහා අදාල නිලධාරීන් යොදවා ඇත.

(ඊ) ආධුනිකයින් 15 කට වැඩි ප්‍රමාණයකින් යුතු සමහර පාඨමාලා සඳහා නියමිත උපදේශකවරයාට අමතරව අතිරේක උපදේශකවරු යොදවා ගැනීමෙන් ගුණාත්මක පුහුණුවක් එම ආධුනිකයන්ට ලබා දීමට කටයුතු සිදුකර ඇත. ( උදා:- ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලා)

(උ) වැටුප් රහිත නිවාඩු ලබා සේවය කරන උපදේශකවරුන් වෙත අදාල වැටුප් වර්ධක ලබා නොදීමටත්, උසස්වීම් හා තනතුරු පිරිනැමීමේදී ඒවා ලබා නොදීමටත් නිර්දේශ නොකිරීම තුලින් ඉදිරියේවත් ගුණාත්මක සේවාවක් ලබා ගැනීමට කටයුතු කිරීමට උපදෙස් අදාල සහකාර අධ්‍යක්ෂවරුන් වෙත ලබා දී ඇත.

(ඌ) පුහුණු කටයුතුවල නොයෙදෙන උපදේශකවරුන් ඉදිරියේ මධ්‍යස්ථානවල රඳවා තැබීමට කටයුතු නොකරන අතර අත්‍යාවශ්‍යම අවස්ථාවකදී එසේ සිදුකිරීමට සිදුවුවහොත් අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ණ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

4.10

(අ) පිළිගනිමි. හදිසි විශේෂ රාජකාරී අවශ්‍යතා මත හිටපු සභාපතිවරයා විසින් අදාළ පරිදි කටයුතු කර ඇත.

(ආ) අදාළ චක්‍රලේඛයේ සඳහන් ප්‍රතිපාදන අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කෙරේ.

(ඇ) මෙම නිලධාරියාගේ සේවය 2012.10.24 දින සිට නතර කර ඇත.

(ඈ) අධ්‍යක්ෂ (පාලන) ලෙස නිලධාරීන් දෙදෙනෙකුට ඉන්ධන දීමනා ගෙවා නොමැත. 2012.09.20 දින සිට අධ්‍යක්ෂ (පාලන) තනතුරේ වැඩ බැලීම සඳහා වෙනත් නිලධාරියෙකු පත් කරන ලද බැවින් 2012 ඔක්තෝබර් හා නොවැම්බර් මාස වල අධ්‍යක්ෂ (පාලන) ලෙස ඉන්ධන දීමනා ගෙවා ඇත්තේ එම නිලධාරියාට වේ. ඒ දක්වා අධ්‍යක්ෂ (පාලන) ලෙස කටයුතු කල නිලධාරියා අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශණ හා රැකියා ගත කිරීම්) තනතුරට පත් කරන ලද බැවින් 2012 ඔක්තෝබර් සිට ඔහු විශ්‍රාම ගත් 2012 නොවැම්බර් මස 05 වන දින දක්වා ඉන්ධන දීමනා ගෙවා ඇත්තේ එම තනතුරට අදාළව වේ.

(ඉ) පිළිගනිමි. වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රේ 104 විධි විධාන අනුව කටයුතු කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

(ඊ) අදාළ අනතුර සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීයාට විරුද්ධව විධිමත් විනයානුකූල පරීක්ෂණයක් පවත්වා පරීක්ෂණ නිලධරියාගේ නිර්දේශ මත විනය නියෝගය නිකුත් කිරීමට කටයුතු කෙරේ.

(උ) මෙවැනි අඩුපාඩුකම් ඉදිරියේදී සිදු නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

5.

(i) පිළිගනිමි. 2012 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම 2012.02.17 දින පාලක මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර 2012.03.02 දින විගණන අධිකාරී, ජාතික අය වැය දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවටත් කාරුණිකව දන්වමි.

(ii) 2012 වසරේදී සංශෝධිත අයවැය ලේඛනය හා සත්‍ය වියදම් වන අතර සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැත.

6. <u>පද්ධති හා පාලනය</u>

| | | |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | අවසන් ගිණුම් හා සැසදෙන යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබේ. |
| (ආ) | මුදල් හා බැංකු කටයුතු | මේ වන විට දිවයින පුරා පවතින සියළුම දිස්ත්‍රික් බැංකු ගිණුම් වලට අදාළ බැංකු සැසදුම් නියමිත දිනට පිළියෙල කර ඇත. |
| (ඇ) | ගිණුම්කරණය | එදිනෙදා ගනුදෙනු එදිනම යාවත්කාලීන වන ගිණුම්කරණ පද්ධතියක් ක්‍රියාත්මක කෙරේ. |
| (ඈ) | වාහන පාලනය | වාහන පාලනය සම්බන්ධයෙන් 2013 වර්ෂයේ විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත. වාහන පාලනය සම්බන්ධයෙන්, රාජකාරී වාහන ඉල්ලුම් කිරීම , බැටරි ලබා ගැනීම, ටයර් යෙදීම, වාහන සේවා කිරීම. රියදුරන් වෙත වාහන භාර දීම හා භාර ගැනීම, වාහන පිටතට යාම සම්බන්ධයෙන් ආකෘති පත්‍ර හඳුන්වා දී ඇති අතර වාහන සඳහා රියදුරන් අනුයුක්ත කිරීම, ඉන්ධන දහනය පරීක්ෂා කිරීම, වාහන පිටතට යාම සම්බන්ධව ආරක්ෂක අංශයට උපදෙස් ලබා දීම, සෑම වාහනයකම මයිලෝ මීටරය ක්‍රියාත්මක වීම සොයා බැලීම ආදී කරුණු සම්බන්ධයෙන් පාලන නියෝග නිකුත් කර ඇත. |
| (ඉ) | අත්තිකාරම් හා මිලදී ගැනීම් | මෙම කාර්යන් ක්‍රමවත් කිරීම සඳහා මේ විට අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කර අභ්‍යන්තර පාලන ක්‍රමය ශක්තිමත් කර ඇත. |

| | | |
|---|---|---|
| (ඊ) | ණයගැතියෝ සහ ණය හිමියෝ | ඉතා පැරණි ණයගැති හා ණය හිමි ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින අතර වර්තමානයේ ණයගැති හා ණය හිමි ශේෂ ඉතා ක්‍රමවත්ව පවත්වා ගෙන යනු ලැබේ. |
| (උ) | කාර්ය මණ්ඩල කලමණාකරණය | අධිකාරියේ කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කර නව කාර්ය මණ්ඩලය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර එකී කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පරිපාටි සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |
| (ඌ) | ගබඩා පාලනය | මේ සඳහා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කර ඇත. |
| (එ) | ආධුනික පුහුණු කටයුතු | මෙම කටයුතු ක්‍රමවත් කිරීම සඳහා කමිටු නිර්දේශ මත 2014 වර්ෂයේ සිට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ. |



කර්නල් එස්. ආර්.පී.රත්නායක ආර්ඩබ්පී,ආර්එස්පී

සභාපති,

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

2014 ජනවාරි මස 02 වැනිදා.